කාර්යසාධන වාර්තාව
செயற்திறன் அறிக்கை
Performance Report
2021



අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சர் அலுவலகம்
Prime Minister's Office



කාර්යසාධන වාර්තාව

2021

අග්‍රාමාත්‍ය කාර්යාලය

විද්‍යුත් ලිපිනය : info@pmoffice.gov.lk
වෙබ් අඩවිය : www.pmoffice.gov.lk
දුරකථන : 011-2575317
ෆැක්ස් : 011-2574143
ලිපිනය : 58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත
කොළඹ 07

පටුන

මාතෘකාව **පිටු අංකය**

1. ආයතනික පැතිකඩ **1**

1.1. හැඳින්වීම 3

1.2. ආයතනික දැක්ම හා මෙහෙවර 4

1.2.1. අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධාන වගකීම් 5

1.3. කාර්ය හා කර්තව්‍යයන් 6

1.4. අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවිධාන ව්‍යුහය 7

2. ප්‍රගතිය හා අනාගත දැක්ම **9**

2.1. සංවර්ධන අංශය 11

2.1.1 සංවර්ධන කටයුතු 11

2.1.2 සැලසුම් කටයුතු 30

2.2. ආයතනික හා විශේෂ කටයුතු අංශය 33

2.2.1 විශේෂ කටයුතු ඒකකය 34

2.2.2 වැඩසටහන් කළමනාකරණ ඒකකය 35

2.2.3 පාර්ලිමේන්තු හා අමාත්‍ය මණ්ඩල කටයුතු ඒකකය 37

2.3. නීතිමය කටයුතු අංශය 43

2.3.1 නීතිමය කටයුතු අංශයේ කාර්යභාරය 43

2.4. මහජන සම්බන්ධතා අංශය 46

2.4.1 මහජන සම්බන්ධතා ඒකකය 46

2.4.2 ආගමික කටයුතු ඒකකය 48

2.5. පාලන අංශය 61

2.5.1 පාලන අනු අංශය I 61

2.5.2 ප්‍රවාහන අංශය 65

පටුන

මාතෘකාව **පිටු අංකය**

2.6. මාධ්‍ය හා සන්නිවේදන අංශය 66

2.6.1. මාධ්‍ය හා සන්නිවේදන අංශයේ කාර්යභාරය 66

2.7. අභ්‍යන්තර විගණන අංශය 69

2.7.1අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරය 69

2.8. ජාත්‍යන්තර කටයුතු පිළිබඳ අංශය 72

2.8.1 ජාත්‍යන්තර කටයුතු අංශයේ කාර්යභාරය 72

3. වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය 79

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 81

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 82

3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය 83

4. ආයතනයේ කාර්යසාධන දර්ශක 85

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්මට අනුව) 87

5. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධනය 93

5.1. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධන දර්ශක 95

5.2. තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමේ ඉලක්ක හා දර්ශක 105

6. මානව සම්පත් පැතිකඩ 117

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 119

6.2. සේවක අතිරික්තය හෝ සේවක හිඟය ආයතනයේ කාර්යසාධනයට බලපාන ආකාරය 119

6.3. මානව සම්පත් සංවර්ධනය 119

7. අනුකූලතා වාර්තාව 123

7.1. අනුකූලතා වාර්තාව 125

8. විගණකාධිපති නිරීක්ෂණ 135

8.1 විගණකාධිපති නිරීක්ෂණ 137

01. ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව යටත් විජිතයක් ව පැවති වර්ෂ 1947 දී අග්‍රාමාත්‍ය තනතුර ස්ථාපිත කරන ලද අතර, බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබීමෙන් පසු වර්ෂ 1972 දක්වා ම මෙම තනතුර "ලංකාවේ අග්‍රාමාත්‍ය" (Prime Minister of Ceylon) නමින් හඳුන්වනු ලැබීය. එතෙක් ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා විසින් එක්සත් රාජධානියේ අග්‍රාමාත්‍යවරයා සතු බලතල හා සමාන බලතල හොබවනු ලැබීය. 1972 වර්ෂයේ සම්මත කරගත් පළමු ජනරජ ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකාව ස්වාධීන හා ස්වෛරී ජනරජයක් බවට පත්වීමෙන් අනතුරුව අග්‍රාමාත්‍ය තනතුර "ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය" (Prime Minister of Sri Lanka) බවට පත් විය. මෙම කාල වකවානුව තුළ දී විදේශ කටයුතු සහ රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ අමාත්‍ය ධුරයේ වගකීම් ද ගරු අග්‍රාමාත්‍යවරයා වෙත පැවරී තිබිණි. 1978 වර්ෂයේ දී සම්මත කරගත් දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් විධායක ජනාධිපති ධුරය හඳුන්වා දීමත් සමග ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය තනතුරෙහි බලතල සංශෝධනය වූ අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් සිය මතය අනුව පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම පමණින් ඇතැයි සලකන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හට අග්‍රාමාත්‍ය ධුරය ලබා දීමට කටයුතු කරයි. තවද, ගරු අග්‍රාමාත්‍යවරයා විසින් අග්‍රාමාත්‍ය ධුරයට අමතරව වෙනත් විෂයයන්ට අදාළ අමාත්‍යාංශවල අමාත්‍ය ධුරද දරනු ලබයි.

1947 වර්ෂයේ දී ප්‍රථම අග්‍රාමාත්‍යවරයා වූ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමාගේ පටන් වර්තමාන අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා දක්වා අග්‍රාමාත්‍යවරු දහතුන් දෙනෙකු (13) අග්‍රාමාත්‍ය ධුරය දරා ඇත. ඒ අතරින් ලෝක දේශපාලනය තුළ කිසිවෙකුටත් නොබිඳිය හැකි වාර්තාවක් තබමින් ගරු සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක මැතිණිය ලොව ප්‍රථම අග්‍රාමාත්‍යවරිය ලෙස පත්වීම මෙරට දේශපාලනයේ ස්වර්ණමය අවස්ථාවක් විය. ඇය තෙවරක් ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධුරය දැරූ අතර දෙවන ධුර කාලයේ දී ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වීම ද විශේෂ සිදුවීමක් විය. තවද, වත්මන් අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අවස්ථා හතරක දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය ධුරයේ කටයුතු කිරීම විශේෂත්වයක් වේ.

1978 වසරේ දී කොළඹ 07, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවතේ පිහිටි "සිරිමතීපාය" මන්දිරය ප්‍රථමවරට අග්‍රාමාත්‍ය කාර්යාලය ලෙස භාවිතයට ගන්නා ලදී. එතැන් පටන් වර්තමානය දක්වා

“සිරිමතීපාය” මන්දිරය මෙරට බිහිවූ කීර්තිමත් අග්‍රාමාත්‍යවරුන් රැසකගේ ම කාර්යාලය වශයෙන් භාවිත කර ඇත.

ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධූරයට පැවරී තිබෙන්නා වූ සුවිශාල වගකීම් සම්භාරය ඉටුකිරීමෙහි ලා අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙත පැවරෙනුයේ සුවිශේෂ කාර්යභාරයකි. 1947 වර්ෂයේ සිට වර්තමාන අග්‍රාමාත්‍ය ලේකම්වරයා දක්වා ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධරයන් 16 දෙනෙකු විසින් එකී සුවිශේෂී කාර්යභාරය ඉටු කර ඇත.

1.2 ආයතනික දැක්ම හා මෙහෙවර

දැක්ම

- “ස්වාධීන, ස්වෛරී හා සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක්”

මෙහෙවර

- “ශ්‍රී ලාංකීය ජනතාවගේ අපේක්ෂාවන් මල්ඵල ගැන්වීම පිණිසත්, ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම පිණිසත්, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින්, යහපාලනයෙන් යුත් විශිෂ්ට රාජ්‍ය යාන්ත්‍රණයක් උදෙසා අවැසි නායකත්වය සැපයීම”

1.2.1 අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධාන වගකීම්

අග්‍රාමාත්‍ය කාර්යාලය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යවරයාගේ නිල රාජකාරි කටයුතු ක්‍රියාත්මක කරන ආයතනයයි. අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහ පෙන්වීම යටතේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" රාජ්‍ය ප්‍රතිපත්ති රාමුවේ අඩංගු දස වැදෑරුම් ප්‍රතිපත්ති මත පදනම්ව ,

- ඵලදායී පුරවැසියෙක්
- සතුටින් ජීවත්වන පවුලක්
- ගුණගරුක විනයගරුක සාධාරණ සමාජයක් සහ,
- සෞභාග්‍යමත් දේශයක්

යන චතුර්විධ අරමුණු ළඟා කර ගැනීම උදෙසා අවශ්‍ය මහ පෙන්වීම, සම්බන්ධීකරණ පහසුකම් සැලසීම හා අවශ්‍ය නායකත්වය සැපයීම අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබයි. තව ද රජයේ සංවර්ධන කාර්යභාරය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දායකත්වය සැපයීමත්, මනා රාජ්‍ය සම්බන්ධීකරණයක් හා ජනතා කේන්ද්‍රීය ප්‍රවේශයක් තුළින් තිරසර ලෙස රටේ සංවර්ධන ඉලක්ක සපුරාගැනීම සඳහා දායකත්වය සැපයීමත් අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.

1.3. කාර්ය හා කර්තව්‍යයන්

- රජයේ ප්‍රතිපත්ති සහ තීරණ ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් ලබාදීම
- අග්‍රාමාත්‍යවරයා මුලසුන හොබවන විවිධ කමිටු හා රැස්වීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, සම්බන්ධීකරණය හා ඒවායේ ප්‍රගතිය පසුවිපරම් කිරීම
- අග්‍රාමාත්‍යවරයාගෙන් පාර්ලිමේන්තුවේදී විමසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැකසීම
- අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට යොමු කරන පනත් කෙටුම්පත්වලට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම
- සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ රාජ්‍ය ආයතනයන් මඟින් දියත් කරනු ලබන සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සම්බන්ධීකරණය, මාර්ගෝපදේශනය, අධීක්ෂණය හා පසුවිපරම් කිරීම
- අග්‍රාමාත්‍යවරයාට රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා පැවැත්වීමට සහ ඒවා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීම
- අග්‍රාමාත්‍යවරයාගේ විදේශ සංචාර සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය හා මෙහෙයවීම
- ජාතික හා ආගමික උත්සව සහ සමාජ සත්කාරක සේවාවන් රාජ්‍ය අනුග්‍රහය සහිතව සංවිධානය කිරීම
- අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කරන මහජන පැමිණිලි හා දුක්ගැනවිලි, අදාළ ආයතන වෙත යොමු කර සහන සැලසීමට අවශ්‍ය කටයුතු කිරීම
- අග්‍රාමාත්‍ය කාර්යාලය, අරලියගහ මන්දිරය සහ අග්‍රාමාත්‍යවරයාගේ නිල නිවාස නිසි පරිදි නඩත්තු කර පවත්වාගෙන යාම
- අග්‍රාමාත්‍ය කාර්යාලයේ දෛනික පරිපාලන හා සංවර්ධන කටයුතු ඉටුකිරීම
- අග්‍රාමාත්‍යවරයා සහභාගීවන රාජ්‍ය හා ජාතික උත්සව සහ විශේෂ අවස්ථා සඳහා මාධ්‍ය ආවරණය සැපයීම

1.4 අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවිධාන ව්‍යුහය



02. ප්‍රගතිය සහ අනාගත දැක්ම

2.1 සංවර්ධන අංශය

2.1.1. සංවර්ධන කටයුතු

“සෞභාග්‍යයේ දැක්ම” දස වැදෑරුම් රාජ්‍ය ප්‍රතිපත්තිය මූලික කර ගනිමින්, අග්‍රාමාත්‍යවරයාගේ විධිවිධානයන්ට යටත්ව ඔහු වෙත පැවරී ඇති කාර්යයන් හා කර්තවයයන් සාක්ෂාත් කර ගැනීම සඳහා සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයෙන් දායකත්වය ලබා දීමත්, ජනතා කේන්ද්‍රීය ප්‍රවේශයක් හා මනා රාජ්‍ය සම්බන්ධීකරණයක් තුළින් තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා දායකත්වය ලබාදීමත්, සංවර්ධන කර්තවයයන් පසුවිපරම් හා ඇගයීම සිදු කිරීමේ පරමාර්ථයත් පෙරදැරිව, අග්‍රාමාත්‍ය කාර්යාලයේ “සංවර්ධන අංශය” ස්ථාපිත කර ඇත.

❖ **සංවර්ධන අංශයේ කාර්යභාරය**

- “සෞභාග්‍යයේ දැක්ම” හා තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා වන රාජ්‍ය යාන්ත්‍රණයක් සකස් කිරීමට අවශ්‍ය දායකත්වය ලබා දීම
- ජාතික හා උප ජාතික රාජ්‍ය ආයතන මඟින් සිදු කරනු ලබන මහා පරිමාණ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා මෙහෙයුම් හා ඇගයුම් සිදු කිරීම
- මනාව සැකසූ දත්ත පද්ධතියක් හා සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ඇති කිරීම
- සැලසුම්කරණය සඳහා අවශ්‍ය යාවත්කාලීන වූ තොරතුරු පද්ධතියක් ඇති කිරීම හා පවත්වාගෙන යාම
- ඵලදායී, මෙහෙයුම් අධීක්ෂණ හා ඇගයීමේ ව්‍යුහයක් ඇති කිරීම

2021 වර්ෂය තුළ අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවර්ධන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන් / වැඩසටහන්

❖ ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ ජාතික වැඩසටහන

රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ආර්ථිකය ගොඩනැගීමේ වැඩපිළිවෙළට සමගාමීව ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීම ද ප්‍රමුඛතම කාර්යයක් ලෙස හඳුනාගෙන ඇත. මේ සඳහා දියත් කරනු ලබන සංවර්ධන ක්‍රියාවලිය කාර්යක්ෂමව බිම් මට්ටම වෙත ගෙන යාම සඳහාත් ප්‍රාදේශීයව හඳුනාගෙන ඇති ගැටලු හා අවශ්‍යතාවයන් කාර්යක්ෂමව හා කඩිනම්ව අදාළ පාර්ශව සඳහා යොමු කිරීම සඳහාත් සුදුසු යාන්ත්‍රණයක් අවශ්‍ය වේ. තවද ප්‍රාදේශීය සංවර්ධන කාර්යයන්හි දී කාර්යක්ෂම අන්තර් අමාත්‍යාංශයීය සම්බන්ධීකරණයක් හා විවිධ අමාත්‍යාංශ අතර ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන් සඳහා යොමු වීමද ඵලදායී වේ. ඒ අනුව මෙම කාර්යයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ග්‍රාමීය ආර්ථිකය නඟා සිටුවීමේ ජාතික වැඩසටහන සංවර්ධන අංශයේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද අතර, ඒ හා අදාළ පසු විපරම් කටයුතු ද මේ වන විට සිදු කරනු ලබයි.

ප්‍රාදේශීය වශයෙන් සපයන සේවාවන් හා ඒවායේ විෂයපථයන්ගේ සම්බන්ධතාවය සැලකිල්ලට ගෙන පහත සඳහන් ආකාරයට රාජ්‍ය අමාත්‍යාංශ හා තෝරාගත් කැබිනට් අමාත්‍යාංශ කමිටු 4 කට වර්ග කරන ලදී.

I. සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව

II. ජීවනෝපාය සංවර්ධන කමිටුව

III. දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටුව

IV. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව

- **අපේක්ෂිත අරමුණු**

  - අමාත්‍යාංශ තුළින් ජනතාවට සපයන සේවාවන් පිළිබඳ දැනුවත් කිරීම.
  - ඉහත අමාත්‍යාංශයන් හි විෂයපථයන්ට අදාළ ඒ ඒ දිස්ත්‍රික්ක තුළ හඳුනාගත් ගැටලු සඳහා කඩිනම් විසඳුම් ලබාදීම.
  - එම අමාත්‍යාංශ අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට සම්බන්ධ වී ප්‍රාදේශීය අනන්‍යතාවයන් හා විභවයන් හඳුනාගැනීම සහ ඒ සඳහා අවශ්‍ය ආංශික සැලසුම් සකස් කිරීම.
  - දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ මහජන නියෝජිතයින්, රාජ්‍ය අමාත්‍යවරුන් හා රාජ්‍ය නිලධාරීන් අතර මනා අන්‍යෝන්‍ය සහසම්බන්ධයක් ගොඩනැගීම මඟින් ඒකාබද්ධ සංවර්ධන යාන්ත්‍රණයක් ඇති කොට ඒ තුළින් ප්‍රාදේශීය හා ජාතික සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම.

එහි මූලික අදියර වශයෙන් ඉහත සඳහන් සෑම කමිටුවක් සඳහාම එක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමක් බැගින් සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි රැස්වීම් පැවැත්වීමට කටයුතු යොදන ලදී.

ඒ අනුව, ඒ ඒ රැස්වීම්වලදී තොරතුරු හුවමාරු කර ගැනීමේ සහ මහජන දුක්ගැනවිලි සඳහා විසඳුම් සෙවීමේ අරමුණින් දේශපාලන අධිකාරිය සහ රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත වේදිකාවන් දිස්ත්‍රික්කය තුළ නිර්මාණය කරන ලද අතර 2021 වර්ෂය තුළ මුළු රැස්වීම් වාර 84 න් 62ක් භෞතිකව පවත්වන ලද අතර ඉතිරි දිස්ත්‍රික්කයන්හි මෙම විෂය ක්ෂේත්‍රයන්ට අදාළ ගැටලු ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය තුරන් කිරීම පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ ජාතික අනුකමිටු හරහා මාර්ගගතව පවත්වන ලද රැස්වීම් මඟින් ලබා ගන්නා ලදී.

දිස්ත්‍රික්ක රැස්වීම් තුළ දී හඳුනාගත් ගැටලු විසඳීම සඳහා අවශ්‍ය පියවර ගැනීම

කමිටුව	රැස්වීම අවස්ථාවේදීම විසඳා අවසන් කළ ගැටලු (%)	පසුව විසඳීම සඳහා වගකීම භාර ගන්නා ලද ගැටලු (%)	ප්‍රතිපත්තිමය තීරණ ලබා දිය යුතු හෝ අන්තර් අමාත්‍යාංශයීය මට්ටමින් විසඳිය යුතු ගැටලු (%)
සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව	11	83	06
ජීවනෝපාය සංවර්ධන කමිටුව	09	86	05
දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටුව	10	82	08
ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව	**16**	**80**	**04**

සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව

දිස්ත්‍රික්ක අනුව පවත්වන ලද රැස්වීම්වල දී ඉදිරිපත් වූ ගැටලු පිළිබඳ සාරාංශය

#	දිස්ත්‍රික්කය	රැස්වීම තුළ විසඳා අවසන් කළ ගැටලු		ඉදිරියේදී විසඳීමට පියවර ගත් ගැටලු		ප්‍රතිපත්තිමය තීරණ ලබා දිය යුතු හෝ අන්තර් අමාත්‍යාංශයීය මට්ටමින් විසඳිය යුතු ගැටලු		ඉදිරිපත් වූ මුළු ගැටලු සංඛ්‍යාව
		සංඛ්‍යාව	(%)	සංඛ්‍යාව	(%)	සංඛ්‍යාව	(%)	
1	අනුරාධපුරය	7	9	67	88	2	3	76
2	කිලිනොච්චිය / යාපනය	1	7	9	60	5	33	15
3	මන්නාරම/ මුලතිව්/ වව්නියාව	3	3	100	97	0	0	103
4	පුත්තලම	6	33	11	61	1	6	18
5	බදුල්ල	5	14	26	72	5	14	36
6	මහනුවර	2	12	13	76	2	12	17
7	මාතලේ	1	4	20	74	6	22	27
8	පොළොන්නරුව	10	20	37	76	2	4	49
9	රත්නපුර	7	18	31	79	1	3	39
10	කෑගල්ල	9	12	63	85	2	3	74
11	කළුතර	3	8	30	81	4	11	37
12	මාතර	4	12	28	88	0	0	32
13	කුරුණෑගල	6	24	18	72	1	4	25
14	ගම්පහ	0	0	33	92	3	8	36
15	ගාල්ල	2	4	44	86	5	10	51
16	කොළඹ	13	57	9	39	1	4	23
17	ත්‍රිකුණාමලය	0	0	48	100	0	0	48
18	මඩකලපුව	4	14	23	82	1	4	28
එකතුව		**83**	**11**	**610**	**83**	**41**	**6**	**734**

ජීවනෝපාය සංවර්ධන කමිටුව

දිස්ත්‍රික්ක අනුව පවත්වන ලද රැස්වීම්වල දී ඉදිරිපත් වූ ගැටලු පිළිබඳ සාරාංශය

#	දිස්ත්‍රික්කය	රැස්වීම තුළ විසඳා අවසන් කළ ගැටලු		ඉදිරියේදී විසඳීමට පියවර ගත් ගැටලු		ප්‍රතිපත්තිමය තීරණ ලබා දිය යුතු හෝ අන්තර් අමාත්‍යාංශයීය මට්ටමින් විසඳිය යුතු ගැටලු		ඉදිරිපත් වූ මුළු ගැටලු ගණන
		සංඛ්‍යාව	(%)	සංඛ්‍යාව	(%)	සංඛ්‍යාව	(%)	
1	මාතලේ	1	5	17	85	2	10	20
2	පොළොන්නරුව	12	13	76	81	6	6	94
3	ගාල්ල	8	11	63	86	2	3	73
4	රත්නපුරය	3	8	31	79	5	13	39
5	මොණරාගල	2	5	38	95	0	0	40
6	මාතර	6	11	51	89	0	0	57
7	නුවරඑළිය	5	9	52	88	2	3	59
8	මහනුවර	4	7	39	71	12	22	55
9	කළුතර	1	4	15	65	7	31	23
10	කෑගල්ල	5	8	55	90	1	2	61
11	කුරුණෑගල	5	18	23	82	0	0	28
12	යාපනය සහ කිලිනොච්චිය	6	17	29	83	0	0	35
13	වව්නියාව, මුලතිව් සහ මන්නාරම	1	3	39	97	0	0	40
14	ගම්පහ	5	6	80	92	2	2	87
15	කොළඹ	4	6	59	91	2	3	65
එකතුව		**68**	**9**	**667**	**86**	**41**	**5**	**776**

දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටුව

දිස්ත්‍රික්ක අනුව පවත්වන ලද රැස්වීම්වල දී ඉදිරිපත් වූ ගැටලු පිළිබඳ සාරාංශය

#	දිස්ත්‍රික්කය	රැස්වීම තුළ විසඳා අවසන් කළ ගැටලු		ඉදිරියේදී විසඳීමට පියවර ගත් ගැටලු		ප්‍රතිපත්ති තීරණ ලබා දිය යුතු හෝ අන්තර් අමාත්‍යාංශයීය මට්ටමින් විසඳිය යුතු ගැටලු		ඉදිරිපත් වූ මුළු ගැටලු ගණන
		සංඛ්‍යාව	(%)	සංඛ්‍යාව	(%)	සංඛ්‍යාව	(%)	
1	අනුරාධපුරය	3	16	13	68	3	16	19
2	ගාල්ල	5	9	45	77	8	14	58
3	හම්බන්තොට	6	14	36	86	0	0	42
4	ත්‍රිකුණාමලය	3	20	6	40	6	40	15
5	කුරුණෑගල	3	15	14	70	3	15	20
6	මොණරාගල	6	15	32	80	2	5	40
7	පොළොන්නරුව	4	14	20	72	4	14	28
8	පුත්තලම	1	7	13	88	1	7	15
9	කොළඹ	1	7	14	93	0	0	15
10	ගම්පහ	6	9	59	88	2	3	67
11	රත්නපුර	2	6	23	72	7	22	32
12	මාතර	2	6	31	94	0	0	33
13	මහනුවර	0	0	17	94	1	6	18
14	කෑගල්ල	2	3	65	93	3	4	70
15	යාපනය/ කිලිනොච්චිය	1	8	11	84	1	8	13
16	වව්නියාව/ මුලතිව්/ මන්නාරම	5	21	19	79	0	0	24
එකතුව		**50**	**10**	**418**	**82**	**41**	**8**	**509**

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව

දිස්ත්‍රික්ක අනුව පවත්වන ලද රැස්වීම්වල දී ඉදිරිපත් වූ ගැටලු පිළිබඳ සාරාංශය

#	දිස්ත්‍රික්කය	රැස්වීම තුළ විසඳා අවසන් කළ ගැටලු		ඉදිරියේදී විසඳීමට පියවර ගත් ගැටලු		ප්‍රතිපත්තිමය තීරණ ලබා දිය යුතු හෝ අන්තර් අමාත්‍යාංශයීය මට්ටමින් විසඳිය යුතු ගැටලු		ඉදිරිපත් වූ මුළු ගැටලු ගණන
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	
1	කිලිනොච්චිය/ යාපනය	2	8	16	67	6	25	24
2	මන්නාරම/ මුලතිව්/ වව්නියාව	1	8	12	92	0	0	13
3	පොළොන්නරුව	3	8	33	89	1	3	37
4	මාතලේ	1	5	16	84	2	11	19
5	ගාල්ල	16	23	51	73	3	4	70
6	මහනුවර	13	50	13	50	0	0	26
7	නුවරඑළිය	2	6	28	88	2	6	32
8	කෑගල්ල	2	3	70	94	2	3	74
9	කුරුණෑගල	0	0	35	100	0	0	35
10	මාතර	10	26	27	71	1	3	38
11	හම්බන්තොට	8	8	96	92	0	0	104
12	අනුරාධපුරය	19	56	15	44	0	0	34
13	බදුල්ල	8	22	25	67	4	11	37
එකතුව		**85**	**16**	**437**	**80**	**21**	**4**	**543**

❖ ප්‍රාදේශීය පරිපාලනයේ සේවා සම්පාදනය ඉහළ නැංවීම

අංක 2172/9 හා 2020.04.22 දිනැති ගැසට් නිවේදනය මඟින් පිහිටුවා ඇති ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය සමඟ ඒකාබද්ධව අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවර්ධන අංශය මඟින් ප්‍රාදේශීය පරිපාලනයේ සේවා සම්පාදනය ඉහළ නැංවීමට ගත යුතු ක්‍රියාමාර්ග සොයා බැලීමටත්, ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමත් අරමුණු කොට වැඩසටහනක් ආරම්භ කරන ලදී. ඒ අනුව විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන යටතේ සේවය කරන ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රාජකාරි ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා අවශ්‍ය විධිමත් වැඩපිළිවෙළක් සකස් කිරීමට විවිධ ආයතන නියෝජනය කරනු ලබන නිලධාරීන්ගෙන් සමන්විත ක්‍රියාකාරී කණ්ඩායම් 5 ක් පිහිටුවන ලදී. එම කණ්ඩායම් මඟින් පහත දක්වා ඇති කරුණු හා ගත යුතු මූලික ක්‍රියාමාර්ග හඳුනාගන්නා ලදී.

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මාර්ගෝපදේශනයක් සහ සංවර්ධන සැලැස්මේ ආකෘතියක් සකස් කිරීම.
2. ප්‍රාදේශීය සංවර්ධන සැලැස්ම පාදක කර ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රැකියා විස්තරය සකස් කිරීම සඳහා පොදු ආකෘතියක් ගොඩනැගීම.
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රාජකාරිවල ප්‍රගතිය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව මැන බැලීමේ හා පසුවිපරම් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම.
4. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රාජකාරි සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීමට සහ එම ක්ෂේත්‍ර නිලධාරීන්ට අදාළ විෂය කරුණු පිළිබඳව වෙනත් පාර්ශවවලට දැනගැනීම සඳහා අත්පොතක් නිර්මාණය කිරීම.

5. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාවන් හි සහ බඳවා ගැනීම් පටිපාටිවල පවතින ගැටලු විසඳීම සහ අදාළ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම.

ඒ අනුව, ප්‍රාදේශීය පරිපාලනයේ සේවා සම්පාදනය ඉහළ නැංවීම සඳහා ඉහත ක්‍රියාමාර්ග හඳුනාගත් අතර, එම විසඳුම් ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව විශේෂ රැස්වීම් 03ක් පවත්වා සාකච්ඡා කිරීම සිදු කළද, පැවති කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ඉදිරි රැස්වීම් පැවැත්වීම සීමා කොට අදාළ කටයුතු ඉටු කරන ලදී. එහිදී, හඳුනාගත් කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායම් 05ක් පිහිටුවන ලදී.

ඒ අනුව, ප්‍රාදේශීය පරිපාලනයේ සේවා සම්පාදනය ඉහළ නැංවීම සඳහා මෙම ක්‍රියාකාරී කණ්ඩායම් හි සම්බන්ධීකරණ කටයුතු හා රැස්වීම් සංවිධානය සිදු කිරීම සහ ඉදිරි කටයුතු මෙහෙයවීම සිදු කරන ලදී.

ප්‍රාදේශීය පරිපාලනයේ සේවා සම්පාදනය ඉහළ නැංවීමේ කමිටු විසින් ඉටු කර ඇති කාර්යයන්

#	කමිටුව	පවත්වා ඇති රැස්වීම් සංඛ්‍යාව	ප්‍රගතිය
1	ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මාර්ගෝපදේශ සහ සංවර්ධන සැලැස්මේ ආකෘතියක් සකස් කිරීම	1	ප්‍රාදේශීය සංවර්ධන සැලැස්මේ ආකෘතිය සකස් කර අවසන් කර ඇත.

#	කමිටුව	පවත්වා ඇති රැස්වීම් සංඛ්‍යාව	ප්‍රගතිය
2	ප්‍රාදේශීය සංවර්ධන සැලැස්ම පාදක කර ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන සියලුම ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රැකියා විස්තරය සකස් කිරීම සඳහා පොදු ආකෘතියක් ගොඩනැගීම.	2	මේ වන විට ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තු සඳහා පොදු ආකෘතියක් කෙටුම්පත් කර අවසන් කර ඇත.
3	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රාජකාරිවල ප්‍රගතිය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව මැන බැලීමේ හා පසුවිපරම් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම.	1	ප්‍රදේශීය ලේකම් කාර්යාලවලින් අවශ්‍ය තොරතුරු ගෙන්වාගෙන ආදර්ශ දත්ත පත්‍රිකාවක් කෙටුම්පත් කර ඇති අතර, එම ආදර්ශ දත්ත පත්‍රිකාව කමිටු ප්‍රධානියා වෙත වැඩිදුර අධ්‍යයනය සඳහා යොමු කර ඇත.
4	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන ක්ෂේත්‍ර නිලධාරීන්ගේ රාජකාරි සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීමට සහ එම ක්ෂේත්‍ර නිලධාරීන්ට අදාළ විෂය කරුණු පිළිබඳව වෙනත් පාර්ශවවලට දැනගැනීමට අත්පොතක් නිර්මාණය කිරීම.	2	කමිටු සාකච්ඡා මඟින් මූලිකත්වය ලබා දිය යුතු විෂය ක්ෂේත්‍ර 12ක් හඳුනා ගන්න ලදී. මූලික කෙටුම්පත් සකස් කර අමාත්‍යාංශ නිරීක්ෂණ / එකඟතාව සඳහා යොමු කර ඇත.

#	කමිටුව	පවත්වා ඇති රැස්වීම් සංඛ්‍යාව	ප්‍රගතිය
5	ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සේවා ව්‍යවස්ථාවල සහ බඳවා ගැනීම් පරිපාටිවල පවතින ගැටලු විසඳීම සහ මෙම නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම.	1	අවශ්‍ය කටයුතු ඉටු කරමින් පවතී.

‘‘ප්‍රාදේශීය පරිපාලනයේ සේවා සම්පාදනය ඉහළ නැංවීම’’ වැඩසටහන ජුලි මස අවසන් වීමට යෝජිතව තිබුණ ද රටේ පවතින කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රැස්වීම් හා සාකච්ඡා නියමිත පරිදි පැවැත්වීමට නොහැකි වූ හෙයින් අදාළ දිනට අවසන් කිරීමට නොහැකි විය.

❖ ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන රැස්වීම්වලදී ලබා දෙන තීන්දු තීරණ සම්බන්ධයෙන් පසුවිපරම් කිරීම

ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබන රැස්වීම් හා සාකච්ඡාවන්හිදී ගනු ලබන තීන්දු තීරණ ක්‍රියාත්මක වීම පිළිබඳව පසුවිපරම් කටයුතු සිදු කිරීම සංවර්ධන අංශය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව 2021 වර්ෂයේ පවත්වන ලද රැස්වීම් හා සාකච්ඡා 47 ක මුලික පසු විපරම් කටයුතු සිදු කර අවසන් කර ඇති අතර, තවත් රැස්වීම් 46 ක මුලික පසුවිපරම් කටයුතු සිදු කරන ලදී.

- **ගරු අග්‍රාමාත්‍යතුමා විසින් අමාත්‍ය ධූරය හොබවන අමාත්‍යාංශවල ප්‍රගති සමාලෝචනය කිරීම**

  ගරු අග්‍රාමාත්‍යතුමා විසින් අමාත්‍ය ධූරය හොබවන අමාත්‍යාංශයන් හි කාර්යයන් විධිමත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පසුවිපරම් කටයුතු සිදු කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

  - **ගරු අග්‍රාමාත්‍යතුමා විසින් අමාත්‍ය ධූරය හොබවන අමාත්‍යාංශයන්**

I. ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය

II. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

   a. ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

III. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

   a. නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
   b. ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
   c. වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය

මීට අමතරව 2021.07.07 දින වන තෙක් ගරු අග්‍රාමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යාංශයේ අමාත්‍යධුරය ද භොබවන ලදී. ඒ දක්වා මුදල් අමාත්‍යාංශයේ හා ඒ යටතේ පැවති දෙපාර්තමේන්තු සහ අනුබද්ධ ආයතනවල පැවැත්වූ රැස්වීම් සඳහා ද මෙම අංශය සහභාගී වන ලදී.

❖ රාජ්‍ය සේවයේ සේවා සම්පාදනය කාර්යක්ෂමව හා මිත්‍රශීලි අයුරින් පවත්වාගෙන යාම හා ඩිජිටල්කරණය කිරීම

මහජනතාව වෙත රාජ්‍ය සේවා සැපයීමේ කාර්යක්ෂමතාවයෙහි පවතින විවිධ ගැටලු සම්බන්ධයෙන් කතිකාවතක් ගොඩනැගී ඇති පසුබිමක, ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහ ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකායේ සභාපති ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මහපෙන්වීම පරිදි රාජ්‍ය සේවයේ සේවා සම්පාදනය කාර්යක්ෂමව සහ මිත්‍රශීලී අයුරින් පවත්වාගෙන යාම පිළිබඳව දැඩි අවධානයක් යොමු වී ඇත. මෙහිදී මහජනතාව වෙත සෘජුවම සේවා සපයනු ලබන ප්‍රධාන අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු මට්ටමේ සිට බිම් මට්ටමේ සේවා සපයනු ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පොලිසිය යනාදී විවිධ ආයතනවල රාජ්‍ය සේවා සම්පාදනයේ කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය කාර්යාලයේ මැදිහත්වීමෙන් සමීක්ෂණයක් සිදු කරන ලදී. එම සමීක්ෂණයේ දී හඳුනාගන්නා ලද ගැටලු සඳහා, දැනට පවතින ක්‍රමවේදයන් හි තාක්ෂණික විසඳුම් ලබාදීම ඔස්සේ එලදායීතාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් මහජනතාවට සෘජුවම සේවා සපයන ආයතන සමඟ සාකච්ඡා මාලාවක් තරුණ හා ක්‍රීඩා අමාත්‍ය, ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සහ ගම සමඟ පිළිසඳර ග්‍රාමීය සංවර්ධන ජනාධිපති කාර්යසාධක බලකායෙහි සභාපති, ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලදී.

තවද, එක් එක් ආයතන විසින් වෙන් වෙන් ව ආයතනික වශයෙන් දත්ත රැස්කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතින බව මහජනතාවට සෘජුව ම සේවා සපයනු ලබන ආයතන සමඟ පවත්වන ලද සාකච්ඡාවහි දී හඳුනාගන්නා ලදී. මෙමඟින් කාර්ය ද්විකරණය, රාජ්‍ය නිලධාරීන්ගේ මෙන්ම මහජනතාවගේ කාලය අපතේ යාම මෙන්ම වෙනත් ඵලදායී කාර්යයන් සඳහා යෙදවීමට ඇති සම්පත් අපතේ යාම වැනි අවාසි සහගත තත්ත්වයන් උද්ගත වී ඇති බව ද අවධාරණය විය. එහෙයින්, ආයතනික වශයෙන් වෙන් වෙන්ව ක්‍රියාත්මක කරනු ලබන දත්ත රැස්කිරීම් වැඩසටහන් වෙනුවට පොදු දත්ත රැස්කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීමේ හැකියාව සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට හා එවන් වැඩසටහනක අඩිතාලම දැමීම උදෙසා රැස්වීම් වාර 06ක් මේ වන විට පවත්වා අවසන් කර ඇත.

එමෙන්ම, ඉහත කී සාකච්ඡා මාලාවට සමගාමීව, වත්මනෙහි කාර්යක්ෂමව මෙන්ම මිත්‍රශීලීව රාජ්‍ය සේවා සම්පාදනය අරමුණු කරගනිමින් රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන සේවාවන් ඩිජිටල්කරණය කිරීම සඳහා එම රාජ්‍ය ආයතන මඟින් දැනට ක්‍රියාත්මක කරනු ලබන තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතීන් කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරන ලදී. ඒ අනුව,

ගරු අග්‍රාමාත්‍යතුමාගේ මහ පෙන්වීම යටතේ එම තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතීන් හි වත්මන් තත්ත්වය සහ ඉදිරි ගමන් මඟ සම්බන්ධයෙන් සාකච්ඡා මාලාවක් තරුණ හා ක්‍රීඩා අමාත්‍ය, ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සහ ගම සමඟ පිළිසඳර ග්‍රාමීය සංවර්ධන ජනාධිපති කාර්යසාධක බලකායෙහි සභාපති, ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කර ඇති අතර ඊට අදාළව, මෙතෙක් පැවැත්වූ රැස්වීම්/ සාකච්ඡා සම්බන්ධ තොරතුරු සාරාංශය පහත දක්වා ඇත.

රාජ්‍ය සේවයේ සේවා සම්පාදනය ඩිජිටල්කරණය කිරීම පිළිබඳව පවත්වා ඇති රැස්වීම්/ සාකච්ඡා

රැස්වීම් අංකය	මාතෘකාව	දිනය
1	ශ්‍රී ලංකා පොලිසියේ සේවා සම්පාදනය ඩිජිටල්කරණය කිරීම පිළිබඳ සාකච්ඡාව	2021.05.21
2	අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡාව	2021.05.24
3	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවා සම්පාදනය ඩිජිටල්කරණය කිරීම පිළිබඳ සාකච්ඡාව	2021.05.28
4	Social Safety Network සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡාව	2021.06.16
5	අධිකරණ අමාත්‍යාංශයේ සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කටයුතු ඩිජිටල්කරණය පිළිබඳ ප්‍රගති සමාලෝචන සාකච්ඡාව	2021.06.28
6	1). බිම් සවිය ව්‍යාපෘතිය හා එහි ඉදිරි ගමන් මඟ පිළිබඳ සාකච්ඡාව 2). පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව: ශ්‍රී ලංකා අනන්‍යසම ඩිජිටල් හැඳුනුම්පත් ව්‍යාපෘතිය	2021.07.06
7	ශ්‍රී ලංකාවේ ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම් සම්බන්ධයෙන් වූ සාකච්ඡාව (National Spatial Data Infrastructure - NSDI)	2021.07.07
8	ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ ව්‍යාපෘති පිළිබඳව ඉදිරිපත් කිරීම (Presentation on the assessment of existing Social Protection Programs)	2021.07.20

❖ ඉහළ ප්‍රතිඵලදායක තරුණ ව්‍යාපාර ගම්මාන ව්‍යාපෘතිය

- **හැඳින්වීම**

තරුණ දිළිඳුකම දීර්ඝකාලීනව තුරන් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් දියත් කිරීම හා තරුණ ප්‍රජාව සවිබල ගැන්වීමට සුදුසු යාන්ත්‍රණයක කාලීන අවශ්‍යතාවය හඳුනාගෙන ඇති අතර ඒ සඳහා, නූතන වෙළඳපොළ හා තාක්ෂණය කෙරෙහි අවධානය යොමු කරමින් තරුණ ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් දියත් කිරීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

ගරු අග්‍රාමාත්‍යතුමාගේ මඟපෙන්වීම පරිදි, තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයකට අනුව ඉහළ ප්‍රතිඵලදායක තරුණ ව්‍යාපාර ගම්මාන මුළු දිවයින ම ආවරණය වන පරිදි පිහිටුවීමට අදහස් කර ඇත. මෙම ව්‍යාපෘතිය ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකාය, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනයන්ගේ සහයෝගයෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර මෙහි නියමු ව්‍යාපෘතිය පොළොන්නරුව, මොණරාගල සහ කිලිනොච්චිය යන දිස්ත්‍රික්කවල ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට යෝජිතව ඇත.

- **අරමුණ**

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ තරුණ තරුණියන් අතර දිළිඳුකම අවම කිරීම හා විද්‍යුත් වාණිජ්‍ය ක්‍රමවේද (e-commerce) මඟින් සමාජ ආර්ථික සංවර්ධනයට තරුණ ප්‍රජාව යොමු කිරීම වන අතර ඊට අමතරව පහත අරමුණු ද මෙම ව්‍යාපෘතිය මඟින් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිත ය.

- ජීවනෝපාය මාර්ග ඇති කිරීම.
- තරුණයින් අතර ව්‍යවසායකත්ව සංස්කෘතියක් ප්‍රචලිත කිරීම.
- ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට අනුකූලව තරුණ ගම්මාන නවීකරණය කිරීම.
- කාබන් විමෝචනයන් රහිත තරුණ ගම්මාන ප්‍රවර්ධනය කිරීම.

- තරුණ පවුල්වල ජීවන තත්ත්වය ඉහළ නැංවීම.
- ජාතික සංවර්ධනය උදෙසා තරුණ තරුණියන් සවිබල ගැන්වීම වෙනුවෙන් තාක්ෂණය පදනම් කරගත් විසඳුම් ලබා දීම.

- **ඉටු කර ඇති කාර්යයන්**

  - මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන ප්‍රධානීන් සහ සියලු පාර්ශවකාර ආයතන දැනුවත් කිරීම සඳහා තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ඒ ඒ විෂයභාර අමාත්‍යවරුන්ගේ හා විවිධ පාර්ශවකාර රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් රැස්වීම් පවත්වන ලදී.
  - මෙම ව්‍යාපෘතියේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිත පොළොන්නරුව, මොණරාගල සහ කිලිනොච්චිය යන දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා සුදුසු ඉඩම් කොටස් තුනක් මේ වන විටත් හඳුනාගෙන ඇත.

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මේ වන විට පවත්වා ඇති රැස්වීම්/ සිදු කර ඇති ක්‍රියාකාරකම් පහත පරිදි දක්වා ඇත.

අංකය	අරමුණ	දිනය
1	තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ අමාත්‍යතුමා විසින් "ඉහළ ප්‍රතිඵලදායක තරුණ ව්‍යාපාර ගම්මාන ව්‍යාපෘතිය" පිළිබඳ සංකල්පය පාර්ශවකාර ආයතනයන් හි අමාත්‍යවරුන් හා නිලධාරීන්ට හඳුන්වාදීම	2021.04.22
2	"ඉහළ ප්‍රතිඵලදායක තරුණ ව්‍යාපාර ගම්මාන ව්‍යාපෘතිය" ට අදාළ සංකල්ප පත්‍රිකාව සැකසීම සම්බන්ධ පූර්ණ සාකච්ඡාව සඳහා කමිටු සාමාජිකයන්ගේ රැස්වීම	2021.04.23

අංකය	අරමුණ	දිනය
3	“ඉහළ ප්‍රතිඵලදායක තරුණ ව්‍යාපාර ගම්මාන ව්‍යාපෘතිය ” සම්බන්ධයෙන් සකස් කළ සංකල්ප පත්‍රිකාවේ අවසන් කෙටුම්පත පිළිබඳ සාකච්ඡාව	2021.04.27
4	“ඉහළ ප්‍රතිඵලදායක තරුණ ව්‍යාපාර ගම්මාන ව්‍යාපෘතිය” ට අදාළ සංකල්ප පත්‍රිකාව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ අමාත්‍යතුමා වෙත භාර දීම	2021.05.03
5	පොළොන්නරුව දිස්ත්‍රික්කයට අදාළව හඳුනාගත් භූමි ප්‍රදේශය නිරීක්ෂණය කිරීම හා ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරීම	2021.05.30
6	“ඉහළ ප්‍රතිඵලදායක තරුණ ව්‍යාපාර ගම්මාන ව්‍යාපෘතියෙහි” ඉදිරි ගමන්මඟ තීරණය කිරීමේ සාකච්ඡාව	2021.07.05
7	පොළොන්නරුව දිස්ත්‍රික්කයට අදාළව හඳුනාගන්නා ලද භූමිය පරීක්ෂා කිරීමට ක්ෂේත්‍ර පරීක්ෂාවක් සංවිධානය කිරීම සඳහා අදාළ පාර්ශවකාර ආයතන ප්‍රධානීන්ගේ සහ ඔවුන්ගේ නම් කළ නියෝජිතයන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද සාකච්ඡාව	2021.07.07
8	පාර්ශවකාර ආයතන වෙනුවෙන් එහි නියෝජිතයන් විසින් සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාව	2021.07.09
9	ඉහළ ප්‍රතිඵලදායක තරුණ ව්‍යාපාර ගම්මාන ව්‍යාපෘතිය පිළිබඳ ප්‍රගති සමාලෝචන සාකච්ඡාව	2021.08.19
10	ආදර්ශ ගම්මානය ස්ථාපිත කිරීමට නියමිත පොළොන්නරුව රිදීතැන්න ප්‍රදේශයේ සිදු කරන ලද ක්ෂේත්‍ර නිරීක්ෂණය පිළිබඳ මාර්ගගතව පවත්වන ලද සාකච්ඡාව	2021.08.26
11	යෝජිත තරුණ ගම්මාන ව්‍යාපෘතියේ ප්‍රධාන සැලැස්ම ඉදිරිපත් කිරීමට අදාළව පවත්වන ලද සාකච්ඡාව (Presentation on the Master Plan of the proposed Ridithenna High Impact Youth Enterprise Village)	2021.09.01

අංකය	අරමුණ	දිනය
12	ඉහළ ප්‍රතිඵලදායක තරුණ ව්‍යාපාර ගම්මාන ව්‍යාපෘතිය පිළිබඳ ප්‍රගති සමාලෝචනය - ප්‍රධාන සැලැස්ම පිළිබඳ සාකච්ඡාව	2021.09.13
13	පොළොන්නරුව දිස්ත්‍රික්කයට මායිම්ව පිහිටි රිදීතැන්න ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට නියමිත තරුණ ව්‍යාපාර ගම්මාන ව්‍යාපෘතිය පිළිබඳ ප්‍රගති සමාලෝචන සාකච්ඡාව	2021.09.17
14	මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවත්වනු ලබූ පාරිසරික අනුමැතිය පිළිබඳ සාකච්ඡාව	2021.09.24
15	යෝජිත තරුණ ගම්මාන ව්‍යාපෘතියේ ප්‍රධාන සැලැස්මට සිදු කළ යුතු සංශෝධන පිළිබඳව පාර්ශවකාර ආයතන දැනුවත් කිරීමට අදාළව පවත්වන ලද සාකච්ඡාව	2021.09.29
16	ගංවතුර සමෝච්ඡ සිතියම් අනුව පිරිසැලසුම් අවසන් කිරීම පිළිබඳ රැස්වීම	2021.12.22

2.1.2 සැලසුම් කටයුතු

❖ අග්‍රාමාත්‍ය කාර්යාලයීය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

ඕනෑම ආයතනයක නිසි කළමනාකරණයක් උදෙසා සඵලදායි සැලසුම්කරණයක් වැදගත් වේ. ඒ අනුව අග්‍රාමාත්‍ය කාර්යාලයේ ද ඉදිරි කටයුතු මෙහෙයවන්නා වූ ආකාරය දැක්වෙන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට අදාළව ඉදිරි වැඩසටහන් හා ව්‍යාපෘතීන් හඳුනා ගත යුතු වේ. එහි දී කාර්යාලයේ එක් එක් අංශ සමඟ සම්බන්ධීකරණය වෙමින් එම අංශයන් මඟින් සිදු කිරීමට අපේක්ෂිත වූ වැඩසටහන් හඳුනා ගැනීම, එම වැඩසටහන් වලට අදාළ තොරතුරු ලබා ගැනීම, එම වැඩසටහන් පිලිබඳ ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශක හඳුනා ගැනීම කළ යුතු වේ. ඉහත කාර්යයන් සිදු කරමින් අග්‍රාමාත්‍ය කාර්යාලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සැලසුම් අංශය විසින් ඉටු කරනු ලබයි. ඒ අනුව 2021 වර්ෂය සඳහා අදාළ ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට සකස් කර ඉදිරිපත් කරන ලදී.

❖ **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව වර්ෂයේ සියලු කාර්තුමය ප්‍රගති වාර්තා සැකසීම**

අග්‍රාමාත්‍ය කාර්යාලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා එක් එක් අංශයන් විසින් සිදු කරන්නා වූ ක්‍රියාකාරකම් හි ප්‍රගතිය මැන බැලීම වැදගත් වේ. එබැවින් අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත ලබාදීම සඳහා කාර්තුමය වශයෙන් එක් එක් අංශයන් විසින් සිදු කරන්නා වූ ක්‍රියාකාරකම් හි ප්‍රගතිය මැන බැලීමේ අරමුණ ඇතිව, කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කිරීම සැලසුම් අංශය මඟින් සිදු කරනු ලබයි. ඒ අනුව 2021.01.01 සිට 2021.12.31 දින දක්වා අදාළ සියලුම කාර්තුමය ප්‍රගති වාර්තා සකස් කර නියමිත දිනට පෙර ඉදිරිපත් කර ඇත.

❖ **වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කිරීම**

සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ප්‍රවර්ථන වර්ෂයේ පළමු කාර්තු ත්‍රිත්වය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් හි ප්‍රගතිය ඇතුළත් ප්‍රගති වාර්තාවක් භාෂා ත්‍රිත්වයෙන් යුක්තව සකස් කර පාර්ලිමේන්තුවේ අයවැය විවාදයේදී සභාගත කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව අග්‍රාමාත්‍ය කාර්යාලයීය වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කිරීමේ මූලික අවස්ථාවේ සිට පාර්ලිමේන්තුවේ අයවැය කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම දක්වා වන සමස්ත කටයුතු සම්බන්ධීකරණය සැලසුම් අංශය විසින් ඉටු කරනු ලබයි. ඒ සඳහා එක් එක් අංශයන් විසින් සිදු කරන්නා වූ ක්‍රියාකාරකම් හි ප්‍රගතිය ඇතුළත් වාර්තා ලබා ගනිමින් භාෂා ත්‍රිත්වයෙන් යුක්තව ප්‍රගති වාර්තාව සකස් කිරීම, මුද්‍රණය කිරීම යන සියලු කාර්යයන් හා සම්බන්ධීකරණය කිරීම සැලසුම් අංශය මඟින් සිදු වේ.

❖ **වාර්ෂික කාර්යසාධන වාර්තා කෙටුම්පත හා කාර්ය සාධන වාර්තාව සැකසීම**

2002.09.12 දිනැති මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4 ඡේදයෙහි විධිවිධාන අනුව සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් ගිණුම් වර්ෂය අවසන් වී දින 150ක් ඇතුළත වාර්ෂික කාර්යසාධන වාර්තා සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතු වේ. ඉහත විධි විධාන මත පදනම්ව අග්‍රාමාත්‍ය කාර්යාලයීය කාර්යසාධන වාර්තාව සකස් කිරීමේ මූලික අවස්ථාවේ සිට පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට

ඉදිරිපත් කිරීම දක්වා වන සමස්ත කටයුතු සැලසුම් අංශය මඟින් ඉටු කරනු ලබන අතර 2020 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවේ කෙටුම්පත විගණකාධිපති වෙත ද කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ද නියමිත පරිදි ඉදිරිපත් කර ඇත.

❖ **අග්‍රාමාත්‍ය කාර්යාලයීය තිරසර සංවර්ධන අරමුණු (SDG's) ලඟා කර ගැනීමේ කාර්යසාධන වාර්තාව සකස් කිරීම**

2015 වර්ෂයේ දී පැවති එක්සත් ජාතීන්ගේ සැසිවාරයේ දී ගන්නා ලද තීරණයකට අනුව වසර 2030 වනවිට ශ්‍රී ලංකාව ද ඇතුලුව රටවල් 192 ක් ඉලක්ක 169 ඔස්සේ සපුරාගත යුතු අරමුණු 17 ක් සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් එකඟතාවක් ඇති කර ගන්නා ලදී. ඒ අනුව අග්‍රාමාත්‍ය කාර්යාලය ද එම වැඩසටහන සඳහා අනුගත වෙමින් තිරසර සංවර්ධන අරමුණු සපුරාගැනීම සඳහා සියලුම අංශයන් හි කාර්ය කටයුතු එම අරමුණු කරා යොමු කරවීම හා එම අරමුණු සපුරාගැනීමේ කාර්යසාධනය ද මැන බැලීම වැදගත් වේ. ඒ අනුව 2020 වර්ෂය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයීය තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ කාර්ය සාධන වාර්තාව නියමිත පරිදි සකස් කර ඉදිරිපත් කරන ලදී.

2.2 ආයතනික හා විශේෂ කටයුතු අංශය

ගරු අග්‍රාමාත්‍යතුමා වෙත පෞද්ගලිකව ලැබෙන ලිපි හා අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලැබෙන විශේෂ අවධානය යොමු කළ යුතු ලිපි පිළිබඳව කටයුතු කිරීම, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන්/අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන රැස්වීම් සංවිධානය කිරීම හා පාර්ලිමේන්තු හා අමාත්‍ය මණ්ඩල කටයුතු සම්බන්ධව ක්‍රියාකිරීම ආයතනික හා විශේෂ කටයුතු අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

මෙම අංශය යටතේ පහත පරිදි ප්‍රධාන අනු ඒකක 03ක් ක්‍රියාත්මක වේ.



2.2.1 විශේෂ කටයුතු ඒකකය

ලැබෙන ලිපි සඳහා පහත සඳහන් ආකාරයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මෙම ඒකකය මඟින් සිදු කෙරේ.

i. ගරු අග්‍රාමාත්‍යතුමා වෙත පෞද්ගලිකව භාරදෙනු ලබන ලිපි
ii. අග්‍රාමාත්‍ය ලේකම් මඟින් යොමු කරනු ලබන විශේෂ ලිපි
iii. පාර්ලිමේන්තුව, පළාත් සභා, පළාත් පාලන ආයතන නියෝජනය කරන දේශපාලන අධිකාරියෙන් ලැබෙන ඉල්ලීම් ලිපි
iv. අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත තැපෑලෙන් ලැබෙන විශේෂ අවධානය යොමු කළ යුතු ඉල්ලීම් ලිපි



ඒ අනුව 2021 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා ලැබුණු ලිපි 4956ක් පිළිබඳව කටයුතු කර ඇත.

මෙයට අමතරව රජයේ ව්‍යවස්ථාපිත ආයතන, සංස්ථා, මණ්ඩල ආදිය සඳහා පත් කිරීමට ගරු අග්‍රාමාත්‍යතුමා විසින් සිදු කරනු ලබන නිර්දේශ ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමත්, ගරු අග්‍රාමාත්‍යතුමා/අග්‍රාමාත්‍ය ලේකම් හමුවීමට පැමිණෙන විශේෂ පුද්ගලයින් හමුවීමත්, ඔවුන් සමඟ සාකච්ඡා කර අදාළ ඉල්ලීම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීමත්, ගරු අග්‍රාමාත්‍යතුමා අමාත්‍යධුර දරන අමාත්‍යාංශවලට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ/අමාත්‍ය මණ්ඩල සටහන් පරීක්ෂා කර ගරු අග්‍රාමාත්‍යතුමාගේ අත්සනට යොමු කිරීමේ අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමත් මෙම ඒකකය මඟින් ඉටු කරනු ලබයි.

2.2.2 වැඩසටහන් කළමනාකරණ ඒකකය

ගරු අග්‍රාමාත්‍යතුමා වෙත විවිධ සංවිධාන, ආයතන සහ පුද්ගලයින් විසින් රැස්වීම්/සාකච්ඡා සඳහා කරනු ලබන ඉල්ලීම් සඳහා ශක්‍යතා අධ්‍යයනයන් සිදු කිරීමත්, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන්/අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබන රැස්වීම්/සාකච්ඡා සංවිධානය කිරීමත්, අදාළ පාර්ශව කැඳවා රැස්වීම් පැවැත්වීම හා රැස්වීම් වාර්තා පිළියෙල කිරීමත් මෙම ඒකකය මඟින් සිදු කරනු ලබන අතර, **2021 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා** ආගමික හා සංස්කෘතික කටයුතු, නාගරික සංවර්ධන හා නිවාස, බැංකු හා මූල්‍ය, කර්මාන්ත, කලා සහ ක්‍රීඩා ආදී විවිධ ක්ෂේත්‍රවලට අදාළවත්, විවිධ ව්‍යක්තිකයන්ගේ ගැටලු පිළිබඳවත් රැස්වීම් හා වැඩසටහන් වාර **167** ක් පවත්වා ඇත. මෙම කාලසීමාව තුළ රැස්වීම් හා වැඩසටහන්වලට අදාළ ශක්‍යතා අධ්‍යයන **(Feasibility Study) 30** ක් සිදු කර ඇත.



ආයතනික හා විශේෂ කටයුතු අංශය මඟින් 2021.01.01 දින සිට 2021.12.31 වන දින දක්වා පවත්වන ලද රැස්වීම් හා වැඩසටහන්වල සාරාංශය පහත පරිදි වේ

මාසය	ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබූ රැස්වීම්	ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබූ වැඩසටහන්	සමස්ත එකතුව
ජනවාරි	9	-	9
පෙබරවාරි	10	-	10
මාර්තු	15	4	19
අප්‍රේල්	2	-	2
මැයි	4	5	9
ජුනි	20	6	26
ජුලි	17	6	23
අගෝස්තු	2	1	3
සැප්තැම්බර්	6	-	6
ඔක්තොම්බර්	17	6	23
නොවැම්බර්	10	10	20
දෙසැම්බර්	10	7	17
එකතුව	**122**	**45**	**167**



2.2.3 පාර්ලිමේන්තු හා අමාත්‍ය මණ්ඩල කටයුතු ඒකකය

❖ අමාත්‍ය මණ්ඩල සංදේශ/අමාත්‍ය මණ්ඩල සටහන් සම්බන්ධ කටයුතු

ගරු අග්‍රාමාත්‍යතුමා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ/අමාත්‍ය මණ්ඩල සටහන් කෙටුම්පත් කර අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම දක්වා වූ ක්‍රියාවලිය ඉටු කිරීම හා අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම මෙම ඒකකය මඟින් සිදු කරනු ලබයි.

ඒ අනුව, 2021 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා විවිධ ක්ෂේත්‍රයන්ට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 22ක් සහ අමාත්‍ය මණ්ඩල සටහන් 14ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

ඉහත අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් අධ්‍යයනයට ලක් කර අමාත්‍ය මණ්ඩලය විසින් එළඹෙන තීරණ අතරින්, අග්‍රාමාත්‍ය ලේකම් විසින් ක්‍රියා කළ යුතු තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ අංශ දැනුවත් කිරීම මෙම ඒකකය විසින් සිදු කරනු ලබයි.

❖ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සාරාංශ සටහන් පිළියෙල කිරීම

අමාත්‍ය මණ්ඩල රැස්වීම් වාර පැවැත්වීමට පෙර අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් සති පතා ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානය සඳහා එවනු ලබන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවන් හි ඇතුළත් කරුණු සාරාංශ කර ගරු අග්‍රාමාත්‍යතුමා වෙත හා අග්‍රාමාත්‍ය ලේකම් වෙත ලබා දීමට කටයුතු කරනු ලබයි. ඒ අනුව, 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සාරාංශ සටහන් 49ක් සකස් කර ඇත.

❖ **අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සම්බන්ධ දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම**

I. සියලුම අමාත්‍යාංශ විසින් තම විෂයපථයට අදාළ කාර්යයන් සම්බන්ධව අමාත්‍ය මණ්ඩලයට යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් ඊට අදාළ නිරීක්ෂණ හා තීරණ පරිලෝකනය කර (scan) දත්ත පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කිරීම.

II. යාවත්කාලීන කරන ලද තොරතුරු අවශ්‍යතාවය හා අදාළ අනුමැතිය මත ලබාදීම.

❖ **යෝජනා සම්මත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම**

අතිගරු ජනාධිපතිතුමා විසින් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන නීතිමය කාර්යයන් අවසන් කර ඇති පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් හා ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු යෝජනා ඇතුලත් යෝජනා සම්මත සකස් කර පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම ද මෙම ඒකකය මඟින් ඉටු කරනු ලබයි. ඒ අනුව, 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා යෝජනා සම්මත 16ක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

❖ **පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම**

අතිගරු ජනාධිපතිතුමාගේ හා ගරු අග්‍රාමාත්‍යතුමාගේ විෂයපථයට අදාළව විපක්ෂ හා ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් විසින් 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා කාලසීමාව ඇතුළත ගරු අග්‍රාමාත්‍යතුමා වෙතින් විමසන ලද වාචික ප්‍රශ්න 31කට පිළිතුරු කෙටුම්පත් කර ඇත. ඒ අනුව,

- අතිගරු ජනාධිපතිතුමාගේ විෂයපථය යටතට අයත් ජනාධිපති කාර්යාලයට අයත් වන කරුණු සම්බන්ධයෙන් වාචික ප්‍රශ්න - 26

- ගරු අග්‍රාමාත්‍යතුමාගේ විෂයපථය යටතට අයත් අග්‍රාමාත්‍ය කාර්යාලයට අයත් වන කරුණු සම්බන්ධයෙන් වාචික ප්‍රශ්න - 05



අතිගරු ජනාධිපතිතුමා අමාත්‍ය ධූර දරන අමාත්‍යාංශ සහ ගරු අග්‍රාමාත්‍යතුමා අමාත්‍ය ධූර දරන අමාත්‍යාංශවලට අදාළව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් (විපක්ෂ හා ආණ්ඩු පක්ෂ) විසින් යොමු කරන ලද වාචික ප්‍රශ්න සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලද පාර්ලිමේන්තු ප්‍රශ්න පහත පරිදි වේ. ඒ අනුව,

අතිගරු ජනාධිපතිතුමා අමාත්‍ය ධූර දරන අමාත්‍යාංශයන්හි විෂයපථය යටතේ,

I.	ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්න	- 19
II.	රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්න	- 16
III.	ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්න	- 03

ගරු අග්‍රාමාත්‍යතුමා අමාත්‍ය ධුර දරන අනෙකුත් අමාත්‍යාංශයන්හි විෂයපථය යටතේ,

I. මුදල් අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්න - 92
(ගරු අග්‍රාමාත්‍යතුමා මුදල් අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාව තුළ)

II. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික
කටයුතු අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්න - 22

III. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්න - 41

IV. ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක
කිරීමේ අමාත්‍යාංශයට අදාළ ප්‍රශ්න - 07

තවද, ජාතික වැදගත්කමකින් යුත් ප්‍රතිපත්තිමය කරුණු ඔස්සේ සෑම මසකම පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන පළමු බදාදා දින ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රශ්න ඇසීමේ අවස්ථාව යටතේ අසනු ලබන වාචික ප්‍රශ්න 04ක් සඳහා පිළිතුරු ලබා දීම සිදු කරනු ලබයි. ඒ අනුව, මෙම කාලසීමාව තුළ දී වාචික ප්‍රශ්න 12ක් සඳහා පිළිතුරු කෙටුම්පත් කර ඇත.

සභාව කල් තැබීමේ යෝජනා 05ක් සඳහා පිළිතුරු කෙටුම්පත් කර ඇත.



❖ පාර්ලිමේන්තු වාර්තා සභාගත කිරීම

අතිගරු ජනාධිපතිතුමාගේ හා ගරු අග්‍රාමාත්‍යතුමාගේ විෂයපථය යටතට ගැනෙන විෂය කරුණු සම්බන්ධයෙන් වන වාර්ෂික වාර්තා, කාර්ය සාධන වාර්තා හා ගිණුම් ප්‍රකාශ යනාදී වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබන අතර, මේ වන විට පහත කරුණු යටතේ වාර්තා විසිහයක් (26)ක් පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. එම වාර්තා පහත පරිදි වේ.

- **කාර්ය සාධන වාර්තා**

i.	ජාතික පොලිස් කොමිෂන් සභාව	- 2019
ii.	ශ්‍රේෂ්ඨාධිකරණය (උපරිමාධිකරණ විනිශ්චයකාරවරු)	- 2019
iii.	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව	-2016, 2017, 2018
iv.	මුදල් කොමිෂන් සභාව	- 2020
v.	රාජ්‍ය සේවා කොමිෂන් සභාව	- 2020
vi.	මැතිවරණ කොමිෂන් සභාව	- 2020
vii.	ජාතික පොලිස් කොමිෂන් සභාව	- 2020
viii.	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	- 2020
ix.	සීමා නිර්ණය කොමිෂන් සභාව	- 2020
x.	පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය	- 2020

- **වාර්ෂික වාර්තා**

i.	විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව	- 2019
ii.	කාර්මික තාක්ෂණ ආයතනය	- 2016
iii.	ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	-2018, 2019
iv.	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	- 2017
v.	ජනාධිපති කාර්යාලය	- 2020

- **නිර්දේශ**

i. මුදල් කොමිෂන් සභාව - 2020
ii. මුදල් කොමිෂන් සභාව - 2021
iii. මුදල් කොමිෂන් සභාව - 2022

- **ස්ථාවර නියෝග 119 (4) වාර්තා**

i. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
ii. අමාත්‍ය මණ්ඩල කාර්යාලය
iii. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
iv. ජාතික විගණන කාර්යාලය
v. මුදල් කොමිෂන් සභාව
vi. ශ්‍රේෂ්ඨාධිකරණය
vii. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය
viii. ජාතික පොලිස් කොමිෂන් සභාව

2.3 නීතී කටයුතු අංශය

2.3.1. නීතී කටයුතු අංශයේ කාර්යභාරය

- ගරු අග්‍රාමාත්‍යවරයාගේ විෂයපථය යටතට ගැනෙන විවිධ නෛතික කාර්යයන්ට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම
- ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ මූලික අයිතිවාසිකම් හා රීට් නඩු හා වෙනත් නඩු සම්බන්ධව ගරු අග්‍රාමාත්‍යවරයා සහ/හෝ අග්‍රාමාත්‍ය ලේකම් වග උත්තරකරු කරමින් පවරා ඇති නඩු කටයුතු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවෙහි අනෙකුත් අදාළ පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම
- ගරු අග්‍රාමාත්‍යතුමා විසින් අමාත්‍යධුර දරන වෙනත් අමාත්‍යාංශවලට අදාළ නීතිමය කටයුතු සම්බන්ධීකරණය කිරීම
- ගරු අග්‍රාමාත්‍යතුමා සහභාගී වන නීති කටයුතු සඳහා අදාළ වන රැස්වීම්, විශේෂ හමුවීම් ආදිය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකිරීම
- ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සම්බන්ධව අවශ්‍ය අවස්ථාවල ඉදිරි කටයුතු කිරීම
- 2021 වර්ෂයේ නීති කටයුතු අංශය වෙත ලැබී ඇති නඩු පැවරීම් හා නීති කෘත්‍යවලට අදාළ නොතීසි ප්‍රමාණයන් පහත පරිදි වේ
  - ශ්‍රේෂ්ඨාධිකරණ නඩු ගොනු - 17
  - අභියාචනාධිකරණ නඩු ගොනු - 04
- සිවිල් නඩු විධාන සංග්‍රහයේ 461 වගන්තිය ප්‍රකාරව එවන ලද දැන්වීම් - 286

- ඉහත දක්වන ලද සියලු ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ නඩු ගොනු සම්බන්ධ කාර්යයන් යාවත්කාලීන කර ඇති අතර, එම නඩු කටයුතු සම්බන්ධව අවශ්‍ය පෙරකලාසි ලබාදී, උපදෙස් අවශ්‍ය අවස්ථාවලදී නීතිපතිවරයා වෙත ලබාදී ඇත

- පාස්කු ප්‍රහාරයේ වින්දිතයින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 461 වගන්තිය ප්‍රකාරව රජයට විරුද්ධව නඩු පැවරීම සඳහා නීතිපතිවරයා වෙත යවා ඇති ලිපි සම්බන්ධව සිදුකරන ලද විමසීම් සම්බන්ධව පිළිතුරු ලබාදී ඇත. මෙවැනි දැන්වීම් මෙම අවස්ථාව වනවිට 286 ක් ලැබී තිබේ

- පහත සඳහන් පනත් කෙටුම්පත් සංශෝධනය කිරීම සහ නීති කෙටුම්පත් සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, සහ අදාළ අමාත්‍යාංශයන්හි ලේකම්වරු සමග කටයුතු කර ඇත
  - ගෝඝාතක පනත සහ සත්ව පනත සංශෝධනය කිරීමේ කෙටුම්පත
  - රජයේ නිලධරයන් දේශපාලන පළිගැනීමට ලක්වීමෙන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත
  - ජාතික පොලිස් කොමිෂන් සභා පනත

- නීති අංශය වෙත යොමු කරන ලද පොදු පැමිණිලි ඉදිරිපත් කරන තැනැත්තන්ට ඔවුන්ගේ ගැටලු සලකා බලා නීති උපදෙස් ලබා දීම සඳහා ඔවුන්ව ගෙන්වා සාකච්ඡා පැවැත්වීම සහ අදාළ ආයතනවලට එකී පැමිණිලි යොමු කර සොයා බලා පියවර ගන්නා ලෙස දැනුම්දීම

- නීති අංශය වෙත ඉදිරිපත් කරන ලද විවිධ ලිපිගොනු නිරීක්ෂණය කර ඊට අදාළ සටහන් සහ නිර්දේශ අදාළ අංශ වෙත යොමු කිරීම

- අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධාරීන් අධිකරණ ක්‍රමය සහ නීති මූලධර්ම පිළිබඳව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ මාලාවේ ආරම්භක සම්මන්ත්‍රණය පැවැත්වීම

- ජනාධිපති කාර්යාලයීය චක්‍රලේඛ අංක CTF/01/2021 හි උපදෙස් අග්‍රාමාත්‍ය කාර්යාලය තුල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනය කර ඊට අදාළ වාර්තා සැපයීම සඳහා දායකත්වය ලබාදීම සහ දත්ත කළමනාකරණ පද්ධතිය ලෙස ලිපි

ගොනු කළමනාකරණ පද්ධතිය අග්‍රාමාත්‍ය කාර්යාලයට හඳුන්වා දීමේදී සහ එය භාවිතා කිරීමේදී පිළිපැදිය යුතු රෙගුලාසි තොරතුරු තාක්ෂණික අංශය සමග සම්බන්ධ වී කෙටුම්පත් කිරීම

❖ **2022 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විශේෂ ඉලක්ක හා ක්‍රියාකාරකම්**

- පාසල් ළමුන් සඳහා නීතිය සහ අධිකරණ ක්‍රමය පිළිබඳ දැනුවත්භාවයක් ලබා දීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කිරීම නැතහොත් මෙම වැඩසටහන මාර්ගගත ක්‍රමයට ක්‍රියාත්මක කිරීම

- රාජ්‍ය නිලධාරීන් සඳහා නීතිය සහ අධිකරණ කටයුතු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම

- මහජනයාට නීතිමය තොරතුරු ලබාදීම සඳහා සඟරාවක් කොටස් 04 කින් යුතුව ප්‍රකාශයට පත් කිරීම

- දත්ත කළමනාකරණ පද්ධතිය ලෙස ලිපි ගොනු කළමනාකරණ පද්ධතිය අග්‍රාමාත්‍ය කාර්යාලයට හඳුන්වා දීමේ දී සහ එය භාවිතා කිරීමේදී අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටිය ඇතුලත් අභ්‍යන්තර චක්‍රලේඛයක් මෙන්ම ආයතන සංග්‍රහයේ දක්වා ඇති ප්‍රතිපාදන වලට අමතරව ලිපි ගොනු කළමනාකරණ පද්ධතිය භාවිතා කරන නිලධාරීන් විසින් එහි ඇතුලත් දත්ත වල රහස්‍යභාවය සුරැකීමේ ගිවිසුමකට එලඹීම සම්බන්ධව නීති සහාය ලබාදීම සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්යමණ්ඩලයේ සියලුම නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති මාලාවක් නීති අංශය සහ තොරතුරු තාක්ෂණ අංශය එක්ව කෙටුම්පත් කිරීම

- පාලන/ මානව සම්පත් හා ඵලදායීතා අංශයේ හා නීති අංශයේ සම්බන්ධීකරණයෙන් තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනයේ (ICTA) සහ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ (SLCERT) සම්පත් දායකත්වය යටතේ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ විධිවිධාන සම්බන්ධයෙන් සහ ඉලෙක්ට්‍රොනික අත්සන් යෙදීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් අදියර කීපයක් යටතේ පැවැත්වීම

2.4 මහජන සම්බන්ධතා අංශය

2.4.1 මහජන සම්බන්ධතා ඒකකය

අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කරනු ලබන මහජන ගැටලු / දුක්ගැනවිලි ඉතා කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කිරීමේ මූලික අරමුණ පෙරදැරිව, අග්‍රාමාත්‍ය කාර්යාලයේ මහජන සම්බන්ධතා අංශය ස්ථාපිත කොට ඇත.

දිවයිනේ සියලු රාජ්‍ය ආයතනවලට අදාළව ඉදිරිපත් කරනු ලබන මහජන පැමිණිලි හා සේවා ඉල්ලීම් කඩිනමින් ඉටුකරදීම සඳහා, අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ. තවද, මහජන ඉල්ලීම් සහ අවශ්‍යතාවයන් අදාළ ආයතනවලින් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය නිරතුරුව විමසමින්, අදාළ මහජන අවශ්‍යතාවයන් ඉටු කිරීම පිළිබඳ පසුවිපරම් කිරීමද සිදු කරනු ලබයි.

තවද, 1965 ඇමතුම් මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරනු ලබන මහජන පැමිණිලි හා සේවා ඉල්ලීම් සම්බන්ධයෙන් ක්ෂණිකව ප්‍රතිචාර දක්වමින්, ඒවා කඩිනමින් ඉටු කර දීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම ද කරනු ලබයි.

2021 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා ලැබුණු මහජන ඉල්ලීම්

#	ඉදිරිපත් වූ මහජන ඉල්ලීම්	සංඛ්‍යාව
1.	ලිපි මඟින් ලද ඉල්ලීම්	34,014
2.	දුරකථන ඇමතුම් • මහජන සම්බන්ධතා අංශය වෙත හා මාණ්ඩලික නිලධාරීන්ගේ පෞද්ගලික දුරකථනය වෙත ලැබුණු ඇමතුම් (දළ වශයෙන්) • 1965 ක්ෂණික ඇමතුම් දුරකතන සේවාව හරහා ලැබුණු ඇමතුම්	62,904 7,644
3.	සෘජු සේවාලාභීන් හමුවීම්	5,621
4.	විද්‍යුත් තැපෑල මඟින් ලද ඉල්ලීම්	1,935
5.	ෆැක්ස් මඟින් ලද ඉල්ලීම්	1,034

2021 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා මහජන ඉල්ලීම් හා පැමිණිලි ඉදිරිපත් වී ඇති ආකාරය



❖ **මහජන සම්බන්ධතා අංශයේ රාජකාරී වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග**

1. දත්ත කළමනාකරණ පද්ධතිය හරහා මහජන සම්බන්ධතා අංශය වෙත ලැබෙන ඉල්ලීම් වඩාත් කාර්යක්ෂමව හා කඩිනම්ව අදාළ අංශය වෙත යොමු කිරීම සහ එම කාර්යය නිසි පරිදි කළමනාකරණය හා අධීක්ෂණය කිරීම සිදු කරනු ලබන අතර, අදාළ දත්ත විශ්ලේෂණය කර වාර්තා සැකසීම සිදු කරනු ලැබේ. ඒ තුළින් පාරදෘශ්‍යභාවය සහ නිලධාරීන්ගේ වගවීම තහවුරු කළ හැකි වීම.

2. නිවාස හා ඉඩම් ගැටලු සම්බන්ධයෙන් නව ආකෘති පත්‍රයක් හඳුන්වාදී, එම ඉල්ලුම්කරුවන්ගෙන් සත්‍ය වශයෙන් අවශ්‍යතාව ඇති සහ ප්‍රමුඛතාවය ලබා දිය යුතු

පුද්ගලයින් ග්‍රාමනිලධාරී නිර්දේශය හා ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතික කිරීම මත සුදුස්සන් තෝරා ගැනීමට අවශ්‍ය කටයුතු පහසු කිරීම.

3. මහජන සම්බන්ධතා අංශයේ ගොඩනැගිල්ල ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් මහජනතාවට වඩාත් කාර්යක්ෂම හා සුහදශීලී සේවාවක් ලබා දීමට කටයුතු කිරීම.

4. මහජන පැමිණිලි සහ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම සඳහා 1965 ක්ෂණික ඇමතුම් අංකය හඳුන්වා දීම තුළින් මහජන දුක්ගැනවිලි සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමට සහ විසඳුම් ලබා දීමට අවශ්‍ය මැදිහත් වීම ලබා දීමට හැකිවීම.

5. ගරු අග්‍රාමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරනු ලබන මහජන දුක්ගැනවිලි හා පැමිණිලි මහජන සම්බන්ධතා අංශයට ලද විට, එය ලද බවට කෙටි පණිවිඩයක් මඟින් දුක්ගැනවිල්ල හෝ පැමිණිල්ල ඉදිරිපත් කරන ලද තැනැත්තා වෙත සන්නිවේදනය කිරීම.

2.4.2 ආගමික කටයුතු ඒකකය

ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ජාතික මට්ටමින් සංවිධානය කෙරෙන ආගමික වැඩසටහන් සහ ආගමික උත්සව පිළිබඳවත්, ආගමික කටයුතු සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කරන ලද ඉල්ලීම් පිළිබඳවත්, ආගමික විෂය සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා විසින් නිකුත් කරනු ලබන ශුභාශිංසන සහ ශෝක පණිවිඩ පිළිබඳවත්, අවශ්‍ය පියවර ගැනීම අග්‍රාමාත්‍ය කාර්යාලයේ ආගමික කටයුතු අංශය මඟින් කටයුතු කරනු ලබයි.

❖ **“අමාදම් සිසිලස” පොහොය දින ධර්ම දේශනා වැඩසටහන**

ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංකල්පයකට අනුව, ප්‍රඥාසම්පන්න දැහැමි ජන සමාජයක් උදෙසා බුදු දහමේ සිසිලස බෙදාදීමේ අරමුණ පෙරදැරිව “අමාදම් සිසිලස” ධර්මදේශනා වැඩසටහන පැවැත්වේ.

2021 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දක්වා පවත්වන ලද ධර්මදේශනා වැඩසටහන් පහත පරිදි වේ

ධර්ම දේශනා වැඩසටහන හා දිනය	දේශකයාණන් වහන්සේ	විස්තරය
206 වැනි ධර්ම දේශනය ජනවාරි 28 වන දුරුතු පොහොය දින	කොළඹ, මාළිගාකන්ද විද්‍යෝදය පිරිවෙනේ ආචාර්ය, ගෞරවාර්හ කෙහෙල්වල නන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ	කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය නිර්දේශ අනුව, සීමිත සැදැහැවතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් විජේරාම මාවත ගරු අග්‍රාමාත්‍යතුමාගේ නිල නිවසේ දී පවත්වන ලදී.
207 වැනි ධර්ම දේශනය පෙබරවාරි 26 වන නවම් පොහොය දින	වයඹ පළාතේ සංඝනායක, වාරියපොල රජමහා විහාරස්ථානයේ විහාරාධිපති හා වාරියපොල ශ්‍රී සුමංගල මහ පිරිවෙනේ පරිවේනාධ්‍යක්ෂ, මහාචාර්ය ගෞරවාර්හ තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ ස්වාමීන්ද්‍රයන් වහන්සේ	සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව සීමිත සැදැහැවතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී .
208 වැනි ධර්ම දේශනය මාර්තු 28 වන මැදින් පොහොය දින	මීතිරිගල නිස්සරණ වනය ආරණ්‍ය සේනාසනාධිපති, ප්‍රධාන කම්මට්ඨානාචාර්ය, ගෞරවාර්හ උඩ ඊරියගම ධම්මජීව ස්වාමීන්ද්‍රයන් වහන්සේ	සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව සීමිත සැදැහැවතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිර පරිශ්‍රයේ රෝපිත බෝධීන් වහන්සේ අභියස දී පවත්වන ලදී.

ධර්ම දේශනා වැඩසටහන හා දිනය	දේශකයාණන් වහන්සේ	විස්තරය
209 වැනි ධර්ම දේශනය අප්‍රේල් 26 වන බක් පොහොය දින	ශ්‍රී ලංකා කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ පාලි හා බෞද්ධ විශ්ව විද්‍යාලයේ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, ගෞරවාර්හ මැදවච්චියේ ධම්මජෝති ස්වාමීන්ද්‍රයන් වහන්සේ	සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව සීමිත සැදැහැවතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී.
210 වැනි ධර්ම දේශනය මැයි 26 වන වෙසක් පොහොය දින	අමරපුර සිරි සුමන විහාර පාර්ශවයේ මහානායක, පන්නිපිටිය ශ්‍රී දෙව්රම් විහාරාධිපති, ආචාර්ය කොලොන්නාවේ සිරි සුමංගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ	සීමිත සැදැහැවතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී
211 වැනි ධර්ම දේශනය ජූනි 24 වන පොසොන් පොහොය දින	උඩුගම්පොල, දොඹවල ශ්‍රී සද්ධර්මගුප්ත පිරිවෙන් මූල මහා විහාරාධිකාරී, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, දර්ශනපති, රාජකීය පණ්ඩිත, ගෞරවාර්හ කොබ්බෑවල මේධංකර ස්වාමීන්ද්‍රයන් වහන්සේ	සීමිත සැදැහැවතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී
212 වැනි ධර්ම දේශනය ජූලි 23 වන ඇසළ පොහොය දින	අනුරාධපුරය, ශ්‍රී සම්බුද්ධ ජයන්ති විහාරයේ විහාරාධිපති, සමස්ත ලංකා ශාසනාරක්ෂක බලමණ්ඩලයේ ගරු උප සභාපති, අනුරාධපුර දිස්ත්‍රික් ශාසනාරක්ෂක බලමණ්ඩලයේ ගරු සභාපති, උතුරු හා උතුරු මධ්‍යම දෙපළාතේ ප්‍රධාන සංඝනායක, පණ්ඩිත, ගෞරවාර්හ නුගේතැන්නේ පඤ්ඤානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ	සෞඛ්‍ය අංශ වෙතින් ලබා දුන් නිර්දේශ අනුව, සීමිත සැදැහැවතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් නුවරඑළිය, අග්‍රාමාත්‍ය නිල නිවසේ දී පවත්වන ලදී

ධර්ම දේශනා වැඩසටහන හා දිනය	දේශකයාණන් වහන්සේ	විස්තරය
213 වැනි ධර්ම දේශනය අගෝස්තු 22 වන නිකිණි පොහොය දින	ශ්‍රී ලංකා ශ්වේජින් නිකායේ නියෝජ්‍ය ලේඛකාධිකාරී, පොකුණුවිට, ශ්‍රී විනයාලංකාරාමවාසී ආචාර්ය ගෞරවාර්හ කුකුල්පනේ සුදස්සී ස්වාමීන්ද්‍රයන් වහන්සේ	සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව ඉතා සීමිත සැදැහැවතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී.
214 වැනි ධර්ම දේශනය සැප්තැම්බර් 20 වන බිනර පොහොය දින	මිනුවන්ගොඩ, පත්තඬුවන භික්ෂු පුහුණු මධ්‍යස්ථානාධිපති, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අතිපූජ්‍ය අනුනායක, ගෞරවාර්හ නැදගමුවේ විජය මෛත්‍රී ස්වාමීන්ද්‍රයන් වහන්සේ	සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව සීමිත සැදැහැවතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී .
215 වැනි ධර්ම දේශනය ඔක්තෝබර් 20 වන වප් පොහොය දින	ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ හිටපු මහෝපාධ්‍යාය සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කොළඹ කොටුව ශ්‍රී සම්බුද්ධාලෝක විහාරය සහ ඉත්තදෙමලිය පුරාණ විහාරය යන උභය විහාරාධිපති, දක්ෂිණ ලංකාවේ උප ප්‍රධාන සංඝනායක, ආචාර්ය ගෞරවාර්හ ඉත්තදෙමලියේ සද්ධර්ම කීර්ති ශ්‍රී චන්දජෝති ඉන්දසර ස්වාමීන්ද්‍රයන් වහන්සේ	සීමිත සැදැහැවතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී .

ධර්ම දේශනා වැඩසටහන හා දිනය	දේශකයාණන් වහන්සේ	විස්තරය
216 වැනි ධර්ම දේශනය නොවැම්බර් 24 වන ඉල් පොහොය දින	වාද්දූව තල්පිටිය බෝධිරාජ මහා විහාරාධිපති කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ අතිපූජ්‍ය අනුනායක හා ප්‍රධාන ලේඛකාධිකාරි ධුරන්දර අග්ගමහා පණ්ඩිත, මහාචාර්ය අතිගෞරවාර්හ කොටපිටියේ රාහුල අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ	සැදැහැවතුන් 150 ක පිරිසකගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී.
217 වැනි ධර්ම දේශනය දෙසැම්බර් 18 වන උඳුවප් පොහොය දින	ඓතිහාසික වාරියපොල, කොළඹගම ශ්‍රී මියුගුණාරාම රජමහා විහාරාධිකාරී නේපාලයේ ලුම්බිණි නුවර ශ්‍රී ලංකා මහා විහාරයේ භාරකාර විහාරාධිපති සමාජ සංවර්ධනය පිළිබඳ සම්මානිත ආචාර්ය, විචිත්‍රභාණී ගෞරවාර්හ ගල්ලැහැපිටියේ පේමරතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ (කොළඹගම පොඩි හාමුදුරුවෝ)	සීමිත සැදැහැවතුන් පිරිසකගේ සහභාගීත්වයෙන් නුවරඑළිය, අග්‍රාමාත්‍ය නිල නිවසේ දී පවත්වන ලදී





❖ ආගමික කටයුතු සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කරන ලද ඉල්ලීම් සම්බන්ධ කටයුතු

ආගමික කටයුතු සම්බන්ධයෙන් ගෞරවනීය ස්වාමීන්වහන්සේලා හා වෙනත් විවිධ පාර්ශව විසින් ගරු අග්‍රාමාත්‍යතුමා වෙත, අග්‍රාමාත්‍ය කාර්ය මණ්ඩල ප්‍රධානී කාර්යාලය වෙත හා අනෙකුත් අංශ වෙත දෙනිකව යොමු කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් අදාළ ආයතන/පාර්ශව සම්බන්ධීකරණය කිරීම හා ඊට අදාළ පසුවිපරම් කටයුතු සිදු කෙරේ. ඒ අනුව, මෙම වර්ෂයේ ආරම්භයේ සිට සිව්වන කාර්තුව දක්වා මෙම අංශය වෙත ලද ලිපි 808ක් සම්බන්ධයෙන් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කර, ලිපි යොමු කරන ලද පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

❖ ප්‍රධාන ආගමික උත්සව කටයුතු සංවිධානය කිරීම පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද සාකච්ඡා

- කොළඹ, ගංගාරාම විහාරස්ථානයේ 42 වන නවම් මහා පෙරහැර, සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව, මහජන සහභාගීත්වයෙන් තොරව හා පෙරහැර චාරිත්‍ර සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් පැවැත්වීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි, 2021 පෙබරවාරි 08 දින මූලික සාකච්ඡාවක් ගංගාරාම විහාරස්ථානයේ දී පවත්වන ලදී.

  එක් එක් ආයතන වෙත පවරන ලද කාර්යයන් එම ආයතන වෙතින් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම තුලින්, 2020 පෙබරවාරි 26 දින කොළඹ නවම් මහා පෙරහැර වීථි සංචාරය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙන ලදී.

- 2021 වර්ෂයේ ගංගාරාම විහාරස්ථාන "බුද්ධරශ්මි වෙසක් කලාපය", පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මහජන සහභාගීත්වයෙන් තොරව "ඩිජිටල් වෙසක් කලාපයක්" වශයෙන් පැවැත්වීම පිළිබඳව සාකච්ඡාවක් අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ගංගාරාම විහාරස්ථානයේ දී පවත්වන ලදී.

එහිදී, එම විහාරස්ථානයේ විහාරාධිකාරී, ආචාර්ය ගෞරවාර්හ කිරින්දේ අස්සජී ස්වාමීන්වහන්සේගේ අනුශාසනා පරිදි ආරක්ෂක අංශ හා අනෙකුත් ආයතනවල සහයෝගයෙන් ඩිජිටල් වෙසක් කලාපය නිර්මාණය කිරීම සඳහා අපේක්ෂිත කාර්යභාරය එම ආයතන සම්බන්ධීකරණය කිරීම තුළින් ඉටු කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලදී.

ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහ එම ආර්යාවගේ සහභාගීත්වයෙන් කලාපයෙහි සමාරම්භක කටයුතු 2021 මැයි 26 දින ගංගාරාම විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව පවත්වන ලද අතර 2021 මැයි 26 දින සිට 28 දින දක්වා පැවැති ‘‘බුද්ධරශ්මි වෙසක් කලාපය’’, විද්‍යුත් මාධ්‍ය මඟින් මහජනතාවට නැරඹීම සඳහා ද අවස්ථාව සලසා දෙන ලදී.

- 2021 වර්ෂයේ ජාතික පොසොන් සැමරුම් රාජ්‍ය උත්සවය, ඓතිහාසික සිතුල්පව්ව විහාරස්ථානය හා ඓතිහාසික මිහින්තලය පූජා භූමිය කේන්ද්‍ර කර ගනිමින්, සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව පැවැත්වීමට අදාළ මූලික සාකච්ඡාව, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ඓතිහාසික සිතුල්පව්ව විහාරස්ථානයේ විහාරාධිපති, ගෞරවාර්හ මැටරඹ හේමරතන ස්වාමීන්වහන්සේ හා මිහින්තලය රජ මහා විහාරයේ විහාරාධිපති, ගෞරවාර්හ වලවාහැංගුණවැවේ ධම්මරතන ස්වාමීන් වහන්සේ ඇතුළු මහා සංඝරත්නයේ වැඩමවීමෙන් 2021 ජූනි 17 වන දින, අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී.

  2021 ජූනි 24 වන පොසොන් පුර පසළොස්වක පොහොය දින ඓතිහාසික සිතුල්පව්ව විහාරස්ථානය හා ඓතිහාසික මිහින්තලය පූජා භූමි කේන්ද්‍ර කර ගනිමින් සැමරුම් ආගමික කටයුතු, අවම ජනතා සහභාගීත්වයකින් සෞඛ්‍ය නිර්දේශ අනුව පවත්වන ලදී. එම ආගමික වැඩසටහන් විද්‍යුත් මාධ්‍ය ඔස්සේ සියලුම සැදැහැවත් ජනතාවට නිවසේ සිට සජීවිව නැරඹීමට ද හැකිවන පරිදි අවශ්‍ය පහසුකම් සංවිධානය කරන ලදී.

❖ ආගමික විෂය සම්බන්ධව ගරු අග්‍රාමාත්‍යතුමා විසින් යොමු කරන ලද සුභාශිංසන පණිවිඩ හා ශෝක පණිවිඩ

විහාරස්ථාන විසින් ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශයන්හි සිදු කරන විවිධ උත්සව සනිටුහන් කරමින් සමරුකළඹ නිකුත් කරනු ලබන අවස්ථාවන්හි දී, ඒ සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ සුභාශිංසන පණිවිඩයක් ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සුභාශිංසන පණිවිඩ නිකුත් කෙරේ. එමෙන්ම ගෞරවනීය ස්වාමීන්වහන්සේලා විෂයෙහි, නායක පදවි අක්ත පත්‍ර ප්‍රදානය කිරීම, විහාරස්ථාන සංවත්සර උත්සව වැනි විශේෂ අවස්ථා පදනම් කර ගනිමින්, ගරු අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කරනු ලබන ඉල්ලීම් අනුව සුභාශිංසන පණිවුඩ නිකුත් කිරීම ද සිදු කරනු ලබයි.

ඒ අනුව, 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා ආගමික විෂයට අදාළව සුභාශිංසන පණිවිඩ 23 ක් නිකුත් කර ඇත.

ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශයන් හි වැඩවසන ගෞරවාර්හ මහානායක, අනුනායක ස්වාමීන්වහන්සේලා, විහාරාධිපති හා අනෙකුත් ස්වාමීන් වහන්සේලා අපවත් වූ අවස්ථාවන්හි දී ඒ සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංවේගය පළ කිරීම සඳහා එතුමාගේ අත්සනින් ශෝක පණිවිඩ නිකුත් කරනු ලැබේ. 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා ශෝක පණිවිඩ 91 ක් නිකුත් කර ඇත.

එමෙන්ම, ත්‍රෛනිකායික මහානායක, අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා, නිකාය පාර්ශව ලේඛකාධිකාරී ස්වාමීන්වහන්සේලා ඇතුළු සමස්ත ලංකා, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලවල ප්‍රධාන තනතුරුධාරී ස්වාමීන්වහන්සේලා මෙන්ම, ජාතික හා ශාසනික මෙහෙවරක නිරත යතිවරයාණන් වහන්සේලා සහ අනෙකුත් ආගමික නායක පූජකතුමන්ලාගේ ජන්ම දින නිමිති කර ගෙන සුභාශිංසන පණිවිඩ 598ක් ගරු අග්‍රාමාත්‍යතුමා වෙතින් යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

❖ විශේෂ ආගමික වැඩසටහන් සංවිධානය කිරීම හා පහසුකම් සැපයීම

පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගමික විශේෂ උත්සව චාරිත්‍රානුකූලව පැවැත්වීම සඳහා ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ලබා

දුන් උපදෙස් අනුව, එම ආගමික කටයුතු/උත්සව සංවිධානය කිරීම සඳහා සම්බන්ධීකරණ සහය ලබා දෙන ලදී.

ඒ අනුව, සීමිත පිරිසකගේ සහභාගීත්වයෙන් පහත සඳහන් වැඩසටහන් සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සලසන ලදී.

- නව කොරෝනා වසංගත තත්ත්වය, ශ්‍රී ලංකාවෙන් මෙන්ම මිහිතලයෙන් දුරුවේවා! යි ප්‍රාර්ථනය කරමින් අනුරාධපුර, ඓතිහාසික මිරිසවැටිය චෛත්‍යරාජයාණන් වහන්සේ අභියස පිරිත් සජ්ඣායනය කිරීමේ ආශිර්වාද ආගමික වැඩසටහන, 2021 සැප්තැම්බර් 07 දින සිට 13 දින දක්වා සත් දිනක් එම පූජා භූමිය කේන්ද්‍ර කර ගනිමින් පවත්වන ලදී.

  ඓතිහාසික මිරිසවැටිය රජමහා විහාරයේ විහාරාධිපති, ගෞරවාර්හ ඊතල වැටුණුවැවේ ඥාණතිලක ස්වාමීන්වහන්සේගේ අනුශාසකත්වයෙන් හා තරුණ හා ක්‍රීඩා අමාත්‍ය/ සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍ය, ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2021.09.01 දින අරලියගහ මන්දිරයේ දී පැවැති සාකච්ඡාවේ දී තීරණය කළ පරිදි එම පුණ්‍ය කර්මය පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.





- නබි නායකතුමන්ගේ ජන්ම දිනය නිමිත්තෙන් මිලාඩ්-උන්-නබි සැමරුම් උත්සවය 2021 ඔක්තෝබර් 19 දින ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් හා සීමිත ආරාධිතයින් පිරිසකගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී. එම සැමරුමට සමගාමීව සැමරුම් මුද්දරයක් ද නිකුත් කරන ලදී.

- මෙම කාර්යයන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙහි මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව සමඟ පවත්වන ලද අතර, ඒ සම්බන්ධව සියලුම සම්බන්ධීකරණ කටයුතු සහ අවශ්‍ය පහසුකම් සැලසීම ආගමික කටයුතු අංශය විසින් සිදු කරන ලදී.

- ඉන්දියාවේ කුෂිනගර් ජාත්‍යන්තර ගුවන් තොටුපල විවෘත කිරීමේ අවස්ථාව සනිටුහන් කරමින් ප්‍රථම ජාත්‍යන්තර ගුවන් ගමන සඳහා ශ්‍රී ලාංකික ධූත පිරිසක් සහභාගී කරවන ලෙස ඉන්දියානු රජය විසින් සිදු කරන ලද ඉල්ලීමට අනුව, ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි, ඒ පිළිබඳව සියලුම ආයතනවල සහභාගීත්වයෙන් සාකච්ඡාවක් අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී.

ඒ අනුව, ගෞරවනීය මහා සංඝරත්නය සියක් නමක් ඇතුලුව විශේෂ ධූත පිරිස, 2021 ඔක්තෝබර් 20 හා 21 දිනයන්හි දී මෙම ගුවන් ගමන සඳහා සහභාගී විය.

මෙම වැඩසටහන සඳහා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ සහය ද සමඟ, අදාළ සියලුම ආයතන සම්බන්ධීකරණය කිරීම මෙන්ම අවශ්‍ය පහසුකම් සැලසීම ද සිදු කරන ලදී.

- කොළඹ 10, ශ්‍රී වජිරාශ්‍රම බෞද්ධ මධ්‍යස්ථානයේ කයින වීවර පුණ්‍යෝත්සවය, ගරු අග්‍රාමාත්‍යතුමාගේ දායකත්වයෙන් 2021 නොවැම්බර් මස 13 සහ 14 දෙදිනයන්හි දී එම විහාරස්ථානය කේන්ද්‍ර කර ගනිමින් සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව සීමිත පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

  එම විහාරස්ථානයේ විහාරාධිපති ගෞරවාර්හ වටිනාපහ සෝමානන්ද ස්වාමීන් වහන්සේගේ අනුශාසනා පරිදි මෙම පුණ්‍යකර්මයේ සංවිධාන කටයුතු පිළිබඳව මූලික සාකච්ඡාවක් 2021.10.29 දින අග්‍රාමාත්‍ය ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සහ අදාළ ආයතන නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී.

  ඒ අනුව, කයින වීවරය අරලියගහ මන්දිරයේ තැන්පත් කිරීම, කයින වස්ත්‍රය රැගත් පෙරහැර පුංචි බොරැල්ල මංසන්ධියේ සිට ශ්‍රී වජිරාශ්‍රම බෞද්ධ මධ්‍යස්ථානය දක්වා වැඩම කරවීම හා විහාරස්ථානයේ දී කයින වස්ත්‍රය සඟ සතුකර පූජා කිරීම ඇතුලු එම පුණ්‍යෝත්සවයේ සියලුම සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

- “ගාන්ධර්ව උරුමය ” (Gandhara Civilization) වාර්තාමය චිත්‍රපටයේ ප්‍රථම ප්‍රදර්ශනය 2021 නොවැම්බර් 16 වන දින ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන්, ගෞරවනීය මහා සංඝරත්නයේ වැඩමකරවීමෙන් හා අනෙකුත් ආගමික නායකයින්ගේ සහභාගීත්වයෙන් හා ශ්‍රී ලංකාවේ පකිස්ථානු මහ කොමසාරිස් කාර්යාලයේ නියෝජිතයින් ඇතුළු 200ක පමණ ආරාධිතයින්ගේ සහභාගීත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී.

  දීර්ඝ කාලයක සිට විශේෂිත වූ ශිෂ්ටාචාරයක් හා සංස්කෘතියක් උරුමව පවතින, දකුණු ආසියානු කලාපීය රාජ්‍යයක් ලෙස පකිස්ථානයේ “ගන්ධාරය” කේන්ද්‍ර කර

ගනිමින් නිර්මාණය කරන ලද මෙම වාර්තාමය චිත්‍රපටය නිෂ්පාදනය කිරීම වෙනුවෙන් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ සහය ලබා දෙන ලදී.

- ප්‍රතිසංස්කරණය කරන ලද ශ්‍රීමතීපාය ගොඩනැඟිල්ලෙහි රාජකාරි කටයුතු අලුතින් ආරම්භ කිරීම විෂය කර ගනිමින් 2021 නොවැම්බර් 20 දින සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනය කිරීමේ පුණ්‍ය කර්මයක් පවත්වන ලදී. එමෙන්ම, ගරු අග්‍රාමාත්‍යතුමාගේ ජන්ම දිනය නිමිත්තෙන් 2021 නොවැම්බර් 21 දින මහා සංඝරත්නය සියක් නමක් විෂයෙහි සංඝගත දක්ෂිණාවක් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී.

  මෙම කටයුතු සංවිධානය කිරීම මෙන් ම අදාළ සම්බන්ධීකරණ කාර්යයන් සිදු කරන ලදී.

- ගරු අග්‍රාමාත්‍යතුමාගේ ජන්ම දිනය විෂය කරගනිමින් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද හොරණ, දෙකඳුවල භික්ෂුණී පුහුණු මධ්‍යස්ථානයේ දී ගෞරවනීය මෙහෙණින් වහන්සේලා 100ක් නමක් විෂයෙහි දානමය පුණ්‍ය කර්මය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ සහය ලබා දෙන ලදී.

- මෙම වර්ෂයේ රාජ්‍ය නත්තල් උත්සවය 2021 දෙසැම්බර් 21වන දින, කෑගල්ල ශාන්ත මේරි දේවස්ථානය කේන්ද්‍ර කර ගනිමින් සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව පවත්වන ලදී. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ මෙම උත්සවය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ සහය ලබා දෙන ලදී.

2.5 පාලන අංශය

2.5.1 පාලන අනු අංශය I

❖ **කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම**

නව රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති මාලාව අනුව යමින් අප රට සංවර්ධනය කරා රැගෙන යන වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේ දී ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ස්ථාපිත කිරීම උදෙසා ආර්ථික හා සමාජයීය ප්‍රතිපත්තීන් සම්පාදනය කිරීම මෙන්ම ඊට අදාළ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ද පැවරී ඇති හෙයින් අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවිධාන ව්‍යුහය වර්තමාන කාර්යභාරයට ගැළපෙන පරිදි ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාව ඇති විය. ඒ අනුව සකස් කරන ලද නව සංවිධාන ව්‍යුහයට ගැළපෙන පරිදි අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්ය මණ්ඩලයට හා අග්‍රාමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට නව තනතුරු ඇති කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, අනුමත කාර්ය මණ්ඩලය සඳහා සුදුසු නිලධරයන්, ස්ථානමාරු කර ගැනීමේ හා පත්වීම් ලබාදීමේ කටයුතු මේ වන විට අවසන් වෙමින් පවතී.

❖ **අග්‍රාමාත්‍ය කාර්යාලය තුළ ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කිරීම**

අග්‍රාමාත්‍ය කාර්යාලය සතු සම්පත් කාර්යක්ෂමතාවකින් හා සඵලතාවකින් යුතු ව පරිහරණය මෙන් ම අභ්‍යන්තර හා බාහිර සේවාලාභීන්ට කාර්යක්ෂම සේවාවක් ලබා දීම යන අරමුණු පෙරදැරි කරගෙන කාර්යාලයීය ඵලදායිතාව ඉහළ නැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක වේ.

ඒ අනුව කාර්යාලයීය නිලධරයන් සඳහා ඵලදායිතා සංකල්පයන් පිළිබඳ මූලික සහතික පත්‍ර පාඨමාලාවක් කණ්ඩායම් 03ක් ඔස්සේ පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී. ඉන් පළමු කණ්ඩායම පාඨමාලාව සාර්ථකව හදාරා නිම කරන ලද අතර, ඉතිරි කණ්ඩායම් 02 සඳහා ද 2022 වර්ෂයේ දී පාඨමාලා ඇරඹීමට කටයුතු කරමින් පවතී.

එමෙන්ම, මූලික සහතික පත්‍ර පාඨමාලාවේ දී වැඩිම ලකුණු ලබා ගත් නිලධරයන් 07දෙනෙකු ඵලදායිතා සංකල්පය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා යොමු කිරීමට ද කටයුතු සංවිධානය කර ඇත.

ඒ අනුව, ඵලදායිතා සංකල්පයන් පිළිබඳ ව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමත්, එමගින් සාමූහික ප්‍රවේශයක් ඔස්සේ නිර්මාණශීලීත්වයට ප්‍රමුඛතාවක් ලබාදීම මගින් 2022 වර්ෂයේ දී ඵලදායිතා සම්මාන තරඟාවලිය සඳහා ඉදිරිපත් වීමට අපේක්ෂා කෙරේ.

❖ සිරිමතීපාය පැරණි ගොඩනැගිල්ල නවීකරණය කිරීම

වසර 105කට අධික ඉතිහාසයක් හිමි අග්‍රාමාත්‍ය කාර්යාලය පිහිටි 'සිරිමතීපාය' වර්ෂ 1916 දී ඉදිකරන ලද පෞරාණික ගොඩනැගිල්ලකි. 2020 වර්ෂයේ දී 'සිරිමතීපාය' පැරණි ගොඩනැගිල්ල නවීකරණ කටයුතු නාවික හමුදාව මගින් සිදු කිරීම ආරම්භ කළ අතර, එහි පෞරාණික හා වාස්තු විද්‍යාත්මක වටිනාකම ආරක්ෂා වන අයුරින් එම කටයුතු අවසන් කර ඇති අතර 2022 ජනවාරි මාසයේ එම ගොඩනැගිල්ලේ අග්‍රාමාත්‍ය කාර්යාලයීය නිල කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතී.

❖ සිරිමතීපාය ග්‍රන්ථය සම්පාදනය කිරීම (Coffee Table Book)

අග්‍රාමාත්‍ය කාර්යාලයේ කටයුතු පවත්වාගෙන යනු ලබන කොළඹ 07, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවතේ පිහිටි 'සිරිමතීපාය' ගොඩනැගිල්ලේ පුරාවිද්‍යාත්මක, වාස්තු විද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකම් අළලා 'සිරිමතීපාය' නැමති ග්‍රන්ථය (Coffee Table Book) සම්පාදනය කිරීමට කටයුතු යොදා ඇත.

1916 වර්ෂයේ ඉදි කරන ලද මෙම මන්දිරයේ ඓතිහාසික හා වාස්තු විද්‍යාත්මක වටිනාකම් ඇතුළත් ලිපි හා ඡායාරූප මෙන් ම 1978 වසරේ සිට මේ දක්වා 'සිරිමතීපාය' අග්‍රාමාත්‍ය කාර්යාලය වශයෙන් භාවිත කරන ලද ගරු අග්‍රාමාත්‍යවරුන්ගේ හා ලේකම්වරුන්ගේ ඡායාරූප ද ඇතුළත් මෙම ග්‍රන්ථය

සම්පාදනය කිරීමේ කටයුතු අවසන්ව ඇති අතර, 2022 ජනවාරි මාසයේ දී ග්‍රන්ථය එළි දැක්වීමට නියමිතය.

මෙම ග්‍රන්ථය එළි දක්වන අවස්ථාවේ දී ග්‍රන්ථය සමඟ සංයුක්ත තැටියක් ලබා දීමටත්, කෙටි සඟරාමය වැඩසටහනක් අග්‍රාමාත්‍ය කාර්යාලයීය වෙබ් අඩවියට ඇතුළත් කිරීමටත් කටයුතු කරමින් පවතී.

❖ **අරලියගහ මන්දිරය, සිරිමතීපාය හා නුවරඑළිය අග්‍රාමාත්‍ය නිල නිවස ඇතුළත් සමරු මුද්දර නිකුත් කිරීම**

ශ්‍රී ලංකාවේ පෞරාණික ගොඩනැගිලි යන තේමාව යටතේ අග්‍රාමාත්‍ය කාර්යාලයට අයත් අරලියගහ මන්දිරය, 'සිරිමතීපාය' හා නුවරඑළිය අග්‍රාමාත්‍ය නිල නිවස යන මන්දිරවල සමරු මුද්දර තුනක් නිර්මාණය කිරීමේ කටයුතු තැපැල් දෙපාර්තමේන්තුව විසින් අවසන් කර ඇති අතර එම සමරු මුද්දර 2022 ජනවාරි මාසයේ දී නිකුත් කිරීමට කටයුතු සංවිධානය කර ඇත.

❖ **ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම (ඩිජිටල්කරණය)**

"සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුවේ මූලික අභිමතාර්ථයක් වන තාක්ෂණය මත පදනම් වන සමාජයක් බිහි කිරීම හා ඩිජිටල්කරණය වූ ශ්‍රී ලංකාවක් ස්ථාපිත කිරීම උදෙසා අග්‍රාමාත්‍ය කාර්යාලය, රාජ්‍ය යාන්ත්‍රණය සරල කිරීමේ මෙවලමක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගනිමින් ඩිජිටල් රාජ්‍ය සේවයක් ඇති කිරීමට සැලසුම් කරයි.

ජනතා කේන්ද්‍රීය කාර්යක්ෂම සේවාවක් සැපයීම සහතික කරමින් අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම කරනු ලබන අතර පරිශීලකයන්ගේ පහසුව සඳහා 2021 වර්ෂයේදී එම වෙබ් අඩවිය ප්‍රතිව්‍යුහගත කරන ලදී.

කොවිඩ් - 19 වෛරස ව්‍යාප්තිය පාලනයට පැනවූ සංචරණ සීමා මධ්‍යයේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තරව සකසන ලද මෘදුකාංග පද්ධති තවදුරටත් වැඩිදියුණු කිරීමෙන් තොරතුරු හා

සන්නිවේදන තාක්ෂණ භාවිතය වැඩි දියුණු කර ඇත. ඒ අනුව, නිලධරයන්ට නිවසේ සිට වැඩ කිරීමට පහසුකම් සැලසීම පිණිස, ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) සඳහා ජංගම යෙදුමක් නිර්මාණය කරන ලදි. මහජන සම්බන්ධතා අංශයේ අවශ්‍යතා සමග අනුගත වන පරිදි ලේඛන කළමනාකරණය පද්ධතිය (DMS) තවදුරටත් සංවර්ධනය කරන ලද අතර, එම අංශයේ ලිපි ගණුදෙනු කළමනාකරණය කිරීම සඳහාත්, ඇමතුම් මධ්‍යස්ථානය හරහා ලැබෙන පැමිණිලි කළමනාකරණය කිරීම සඳහාත්, සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. ඉහත ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) අග්‍රාමාත්‍ය කාර්යාලයේ අනිකුත් අංශ සඳහාද හඳුන්වා දීමට කටයුතු සම්පාදනය කර ඇත.

තවද අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රවාහන ශාඛාව සඳහා සකස් කරන ලද දත්ත පද්ධතිය, දැනුවත් කිරීමේ කෙටි පණිවිඩ පහසුකමත් සමග ඒකාබද්ධ කළ අතර, මොබිටෙල් පුද්ගලික සමාගමෙන් SMS ද්වාර පහසුකම අනුග්‍රහයක් ලෙස නොමිලේ ලබා ගැනීමට කටයුතු යොදා ඇත. මෙම පහසුකම ලබා ගත් පසු අනෙකුත් පද්ධතිද කෙටි පණිවුඩ පහසුකම සමග ඒකාබද්ධ කිරීමට බලාපොරොත්තු වේ.

රැස්වීම් කළමනාකරණය කිරීම සහ සංවර්ධන කටයුතු අධීක්ෂණය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අනු අංශය මගින් නව දත්ත පද්ධතියක් සංවර්ධනය කරමින් පවතී. එම දත්ත පද්ධතිය 2022 වර්ෂයේ මුල් කාර්තුවේදී පරීක්ෂණාත්මක මට්ටමින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

නවීන සයිබර් තර්ජනයන්ට මුහුණ දීමට හැකි වන පරිදි අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවියේත් විද්‍යුත් තැපැල් සේවාදායක පරිගණකයේත්, අභ්‍යන්තර සේවාදායක පරිගණකයේත් සයිබර් ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.

2.5.2 ප්‍රවාහන අංශය

❖ ප්‍රවාහන පහසුකම් හා සම්බන්ධ කටයුතු

අග්‍රාමාත්‍ය කාර්යාලයේ සංවිධාන ව්‍යුහයට අනුව, කාර්ය මණ්ඩල සඳහා අඩු පිරිවැයකින් අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සපුරා ගැනීමට ශ්‍රී ලංකා රේගුව මඟින් රාජසන්තක කරන ලද වාහන මෙම කාර්යාලයට ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා රේගුව මඟින් රාජසන්තක කරන ලද වාහන කිහිපයක් අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලබාගත් අතර රාජසන්තක කරන ලද තවත් වාහන කිහිපයක් ඉදිරියේ දී ලබා ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. තවද, භාවිතයෙන් ඉවත් කර තිබූ වාහන අවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදු කොට ධාවන කටයුතු සඳහා යොදා ගන්නා ලදී.

අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රවාහන පහසුකම් ලබා දීම කාර්යක්ෂම කිරීම සඳහා මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දී ඇත. ඒ අනුව, සියලු රථ වාහන වල සේවා කටයුතු, අලුත්වැඩියා කටයුතු, ඉන්ධන ලබා ගැනීම් සම්බන්ධ තොරතුරු, රියදුරු මහතුන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීමේ හැකියාව ඇත. තවද රාජකාරී ගමන් සඳහා ලබා දෙන වාහන සම්බන්ධව තොරතුරු SMS පහසුකම යටතේ ඉල්ලුම් කරන නිලධරයාටත්, රියදුරු මහතා වෙතත් යැවීමට හැකි ලෙස මෘදුකාංගය සංවර්ධනය කර ගැනීමට කටයුතු කර ගෙන ඇති අතර එමඟින් ප්‍රවාහන අංශයේ කටයුතු කාර්යක්ෂම කර ගැනීමට හැකි වී ඇත.

2.6 මාධ්‍ය හා සන්නිවේදන අංශය

2.6.1 මාධ්‍ය හා සන්නිවේදන අංශයේ කාර්යභාරය

ගරු අග්‍රාමාත්‍යතුමා, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ ගරු අග්‍රාමාත්‍යතුමා යටතේ පවතින අමාත්‍යාංශ මඟින් සිදුකරනු ලබන සංවර්ධන හා සමාජයීය කාර්යයන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා විධිමත්, ක්‍රමවත් සහ බලාත්මක මාධ්‍ය භාවිතයක් සිදු කිරීම අවශ්‍ය වේ. එසේම ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහ අග්‍රාමාත්‍ය කාර්යාලයේ මෙන්ම ගරු අග්‍රාමාත්යතුමා යටතේ පවතින අමාත්‍යාංශවල සිදුකරන ලද අතීත හා වර්තමාන මෙහෙවර අනාගතය වෙනුවෙන් සංරක්ෂණය කිරීම ද සමාජයීය අවශ්‍යතාවයක් සහ කළ යුතු කාර්යයක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව කාර්යයන් ඉටු කිරීම මාධ්‍ය හා සන්නිවේදන අංශය මඟින් විධිමත්ව හා ක්‍රමවත්ව සිදු කරනු ලබයි.

- **ප්‍රධාන අරමුණු**

1. ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ආර්ථික හා සමාජයීය සංවර්ධන කටයුතු පිළිබඳව මාධ්‍ය මඟින් ජනතාව දැනුවත් කිරීම.
2. ගරු අග්‍රාමාත්‍යතුමාගේ දේශපාලන හා සමාජයීය ක්‍රියාවලට අදාළ දර්ශන/ ඡායාරූප/ වාර්තා සංරක්ෂණය කිරීම .
3. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් මාධ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී දායකත්වය සහ සම්බන්ධීකරණය ලබාදීම.

- **මාධ්‍ය අංශයේ ප්‍රචාරණ ක්‍රියාකාරීත්වය**



මෙහිදී උත්සව, අවස්ථා, සාකච්ඡා, ප්‍රවෘත්ති සාකච්ඡා සඳහා මාධ්‍ය සම්බන්ධීකරණය ද ඊට අදාළව ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම ප්‍රධාන කාර්යයක් වන අතර ගරු අග්‍රාමාත්‍යතුමාගේ පණිවුඩ මාධ්‍ය වෙත නිකුත් කිරීම ද සිදු කරනු ලබයි. මෙම ක්‍රියාකාරීත්වයේදී මාධ්‍ය හමු සංවිධානය කිරීම, ප්‍රවෘත්ති මැදිරිය (NEWS ROOM) පවත්වාගෙන යෑම, දේශපාලන තීරුලිපි සඳහා තොරතුරු ලබා දීම, අග්‍රාමාත්‍ය සන්නිවේදන හා මාධ්‍ය අංශය සඳහා ප්‍රවෘත්ති වෙබ් අඩවියක් පවත්වාගෙන යාම සිදු කරනු ලබයි.

මාධ්‍ය හා සන්නිවේදන අංශය යටතේ පහත ඒකක ක්‍රියාත්මක කරනු ලබයි.

- මාධ්‍ය ඒකකය
- සන්නිවේදන ඒකකය
- ඡායාරූප ඒකකය
- වීඩියෝ ඒකකය
- නව මාධ්‍ය ඒකකය
- විදේශ මාධ්‍ය ඒකකය

2.7 අභ්‍යන්තර විගණන අංශය

2.7.1.අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරය

අග්‍රාමාත්‍ය ලේකම්තුමා විසින් ඉදිරිපත් කිරීමට නියෝග ලබාදෙන විගණන වාර්තා ලබාදීම, ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්තුමය ඇගයීම් වාර්තා ජාතික විගණන කාර්යාලය හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීම හා එම ආයතනයේ මාර්ගෝපදේශකත්වයට අනුකූලව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

2021 ජනවාරි 01 වන දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා මෙම අංශය විසින් ඉටුකරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි දැක්විය හැකිය.

#	ක්‍රියාකාරකම්	ප්‍රගතිය
1.	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශන්ට අනුකූලව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම	2021.02.16 දින පලමු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම සහ රැස්වීම් වාර්තා අදාළ අංශ වෙත යොමු කරන ලදී.
		2021.12.16 දින දෙවන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පැවැත්වීම හා රැස්වීම් වාර්තා අදාළ අංශ වෙත යොමු කරන ලදී.
2.	ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ඇගයීම් වාර්තාව කාර්තුමය වශයෙන් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යැවීම	2020 අවසාන කාර්තුවට අදාළ ඇගයීම් වාර්තාව 2021.03.17 දින ඉදිරිපත් කර ඇත. 2021 තුන්වන කාර්තුවට අදාළ ඇගයීම් වාර්තාව 2021.11.26 දින ඉදිරිපත් කර ඇත.

#	ක්‍රියාකාරකම්	ප්‍රගතිය
3.	අභ්‍යන්තර විගණන වාර්තා කාර්තුමය වශයෙන් ජාතික විගණන කාර්යාලය වෙත යැවීම	**කාර්තු වාර්තා ඉදිරිපත් කිරීම** • 2021.02.28 -2020 වසරේ අවසන් කාර්තුව • 2021.08.16 -2021 වසරේ දෙවන කාර්තුව • 2021.10.15 -2021 වසරේ තුන්වන කාර්තුව
4	කාලීන අවශ්‍යතාවට අනුකූලව අග්‍රාමාත්‍ය ලේකම්තුමා විසින් ඉදිරිපත් කිරීමට නියෝග ලබා දෙන විගණන වාර්තා ලබා දීම	කලින් කලට අග්‍රාමාත්‍ය ලේකම්තුමා විසින් ඉදිරිපත් කරන ලෙස දන්වන විගණන වාර්තා ලබා දීම **වියදම් වාර්තා ඉදිරිපත් කිරීම** • 2021.02.28 – 2020 වසරේ අවසන් කාර්තුව • 2021.08.16 - 2021 වසරේ දෙවන කාර්තුව • 2021.10.15 – 2021 වසරේ තුන්වන කාර්තුව
5.	ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය යටතේ උතුරු හා නැගෙනහිර පළාත්වල ගෘහ ආර්ථික සංවර්ධනය සහ ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම. අත්පොත් මුද්‍රණයේ දී සහ භාෂා පරිවර්තන කටයුතු වලදී පහසුකම් සැලසීම.	උතුරු හා නැගෙනහිර පළාත්වල නිලධාරීන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කර කමිටුවේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි වෙත අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කරන ලදී. අත්පොත් සහ ලේඛන වල භාෂා පරිවර්තන කටයුතු සිදු කරන ලදී.

#	ක්‍රියාකාරකම්	ප්‍රගතිය
6.	ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය සමඟ සම්බන්ධ වී එම කමිටුවේ කටයුතු සඳහා සහය ලබාදීම	2021 වර්ෂය තුළ රැස්වීම් කැඳවීම, රැස්වීම් වාර්තා පිළියෙල කිරීම, ප්‍රගති සමාලෝචනය සිදු කරන ලදී.

2.8 ජාත්‍යන්තර කටයුතු පිළිබඳ අංශය

2.8.1 ජාත්‍යන්තර කටයුතු පිළිබඳ අංශයේ කාර්යභාරය

අග්‍රාමාත්‍ය කාර්යාලය වෙනුවෙන් රාජ්‍යතාන්ත්‍රික සබඳකම් සහිත රාජ්‍යතාන්ත්‍රික හා කොන්සියුලර් කටයුතු සම්බන්ධ ක්‍රියාකාරකම් සහ ජාත්‍යන්තර ක්‍රියාකාරකම් හා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

- **ගරු අග්‍රාමාත්‍යතුමාගේ නිල විදේශ සංචාර**

2021.01.01. දින සිට 2021.09.30 කාලපරිච්ඡේදය තුළ ගරු අග්‍රාමාත්‍යතුමන් පහත සඳහන් නිල විදේශ සංචාරයන්හි යෙදී ඇත.

- 2021 මාර්තු 19-20 - බංගලාදේශය
- 2021 සැප්තැම්බර් 10-15 - ඉතාලිය

- **ඉහළ පෙළේ විදේශ ප්‍රභූවරුන්ගේ ශ්‍රී ලංකා සංචාර හා රාජ්‍යතාන්ත්‍රික හමුවීම්**

රාජ්‍යතාන්ත්‍රික හා කොන්සියුලර් කටයුතු ඇතුළු ජාත්‍යන්තර ක්‍රියාකාරකම් හා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ විදේශීය ප්‍රභූවරුන් ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ නිල හමුවීම් පවත්වනු ලබයි. එම නිල හමුවීම් ජාත්‍යන්තර කටයුතු පිළිබඳ අංශය මඟින් සම්බන්ධීකරණය කරනු ලබයි.

2021.01.01. දින සිට 2021.12.31 දින දක්වා විදේශ ප්‍රභූවරුන්ගේ නිල ශ්‍රී ලංකා සංචාර

අංකය	දිනය	සංචාරයෙහි නියුතු ප්‍රභූවරුන්ගේ නාමය
1	2021.01.05	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නියෝජිත හමුව
2	2021.01.06	ගරු. ආචාර්ය එස්. ජෛශංකර් මැතිතුමා ඉන්දීය විදේශ කටයුතු අමාත්‍ය
3	2021.02.23	අතිගරු ඉම්‍රාන් ඛාන් මැතිතුමා පකිස්ථානු අග්‍රාමාත්‍ය
4	2021.04.28	ජෙනරාල් වී ෆෙන්ග් මැතිතුමා චීනයේ රාජ්‍ය උපදේශක සහ ජාතික ආරක්ෂක අමාත්‍ය
5	2021.11.04	හාර්ටවිග් ෂැෆර් මහතා දකුණු ආසියානු කලාපය සඳහා වන ලෝක බැංකු උප සභාපති
6	2021.11.09	අතිගරු ඊබ්‍රාහිම් මොහොමඩ් සොලිහ් මැතිතුමා මාලදිවයින් ජනාධිපති
7	2021.11.17	ටකේමා සකමොටෝ මහතා දකුණු ආසියානු කාලාපයේ ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනයේ අධ්‍යක්ෂ ජනරාල්
8	2021.12.07	ටෙන්සින් ලෙක්පෙහෙල් මහතා බිම්ස්ටෙක් සංවිධානයේ මහලේකම් (BIMSTEC)
9	2021.12.15	කන්නි විග්නරාජා මෙනෙවිය එක්සත් ජාතීන්ගේ සහකාර ලේකම්, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ සහකාර පරිපාලක සහ එක්සත් ජාතීන්ගේ ආසියා සහ පැසිෆික් කලාපීය කාර්යාංශයේ කලාපීය අධ්‍යක්ෂ

2021.01.01. දින සිට 2021.12.31 දින දක්වා රාජ්‍යතාන්ත්‍රික හමුවීම්

අංකය	මාසය	රැස්වීම් සංඛ්‍යාව
1	ජනවාරි	02
2	පෙබරවාරි	04
3	මාර්තු	04
4	මැයි	01
5	ජුනි	02
6	අගෝස්තු	04
7	සැප්තැම්බර්	01
8	ඔක්තොම්බර්	09
9	නොවැම්බර්	02
10	දෙසැම්බර්	04

ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් 2021.01.01 දින සිට 2021.12.31 නිකුත් කරනු ලැබූ මුද්‍රිත සුභ පැතුම්, ශුභාශිංසන සහ ශෝක ප්‍රකාශන පණිවුඩ (දේශීය හා විදේශීය)

අංකය	මාසය	පණිවුඩ සංඛ්‍යාව (විදේශීය / දේශීය)
1	ජනවාරි	12
2	පෙබරවාරි	02
3	මාර්තු	01
4	අප්‍රේල්	06
5	මැයි	03
6	ජුනි	07
7	ජූලි	05
8	අගෝස්තු	03
9	සැප්තැම්බර්	02
10	ඔක්තොම්බර්	10
11	නොවැම්බර්	03
12	දෙසැම්බර්	04

❖ **විශේෂ සිදුවීම්, වැඩසටහන් හා අනෙකුත් ජාත්‍යන්තර ක්‍රියාකාරකම්**

- ශ්‍රී ලංකාව සහ චීන සබඳතා සහ චීන කොමියුනිස්ට් පක්ෂයේ (CPC) 100 වැනි සංවත්සරය සනිටුහන් කිරීම උදෙසා සමරු කාසියක් මුද්‍රණය කිරීම.

- හරිත රූපවාහිනිය මඟින් විකාශනය කරන ජාත්‍යන්තරව පිළිගත් "True Little Monk" වැඩසටහන් මාලාව විකාශනය කිරීම.

  වෙසක් පුර පසළොස්වක පොහොය දින (2021 මැයි 27) කොළඹ, ගංගාරාම විහාරස්ථානයේදී පැවැත්වූ "බුද්ධ රශ්මි" ජාතික වෙසක් වැඩසටහන 2021 අතරතුර, හරිත රූපවාහිනිය මඟින් ජාත්‍යන්තර සම්මානලාභී "True Little Monk" වාර්තාමය වැඩසටහන් මාලාවේ විකාශනය ආරම්භ කෙරිණි. කථාංග 31 කින් සමන්විත මෙම කතා මාලාව True Channel නාලිකාව, තායිලන්තයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය කාර්යාලය සමඟ එක්ව ශ්‍රී ලංකාවේදී ප්‍රථම වරට විකාශනය වේ.

- පකිස්ථානු-ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන සහයෝගිතා වැඩසටහන යටතේ ඇලමා ඉක්බාල් ශිෂ්‍යත්ව - 2021 අගෝස්තු

  පකිස්ථානු-ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන සහයෝගිතා වැඩසටහන යටතේ පකිස්ථානයේ උසස් අධ්‍යාපන කොමිෂන් සභාව (HEC) විසින් ඇලමා ඉක්බාල් ශිෂ්‍යත්වය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. වසර පහක් පුරාවට ව්‍යාප්ත වූ ඇලමා ඉක්බාල් ශිෂ්‍යත්වය මඟින් ශ්‍රී ලාංකික සිසුන් 1000 කට පාකිස්ථානය වෙත ගොස් ඉංජිනේරු විද්‍යාව, මූලික හා ස්වාභාවික විද්‍යාව සහ සමාජ විද්‍යාව පිළිබඳ උපාධි, පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි පාඨමාලා හැදෑරීමට අවස්ථාව සැලසේ. වැඩසටහන ප්‍රසිද්ධියට පත් කිරීමට සහ අයදුම්පත් එකතු කිරීමට අග්‍රාමාත්‍ය කාර්යාලය පාකිස්තාන මහ කොමසාරිස් කාර්යාලය සමඟ එක්ව කටයුතු කරන ලදී.

- 33 වන රාවල්පිණ්ඩි වාණිජ හා කර්මාන්ත මණ්ඩලය (RCCI) ජාත්‍යන්තර ජයග්‍රහණ සම්මාන සහ ව්‍යාපාර අවස්ථා සමුළුව, කොළඹ -2021 නොවැම්බර් 23

  කොළඹදී පැවැත්වෙන 33 වන රාවල්පිණ්ඩි වාණිජ හා කර්මාන්ත මණ්ඩල (RCCI) ජයග්‍රහණ ප්‍රදානය (IAA) සහ ව්‍යාපාර අවස්ථා සම්මන්ත්‍රණයෙහි (BOC) ප්‍රධාන ආරාධිතයා වශයෙන් සහභාගී වීමට අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට ආරාධනා කර ඇත. මෙම සමුළුව සඳහා ව්‍යාපාරික නියෝජිතයින් 200 ක් පමණ සහභාගී විය. දෙරටේම ආයෝජකයින්, අපනයනකරුවන් සහ ආනයනකරුවන් විශාල සංඛ්‍යාවක් ඒකරාශී කර ගැනීමේ අභිප්‍රායෙන් යුතුව ශ්‍රී ලංකාව සහ පාකිස්ථානය අතර ද්විපාර්ශ්වික වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම මෙම වැඩසටහනෙහි අරමුණ විය. 2021 අගෝස්තු මාසයේදී පැවැත්වීමට සැලසුම් කර තිබූ මෙම වැඩසටහන පවතින කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කල් දැමූ අතර 2021 නොවැම්බර් මාස 23 වන දින වැඩසටහන පවත්වන ලදී.

- ජාත්‍යන්තර මව් භාෂා දින සැමරුම සඳහා වීඩියෝ පණිවුඩය - 2021 පෙබරවාරි 21

  බංගලාදේශ මහ කොමසාරිස් කාර්යාලය සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව සංවිධානය කළ මෙම සැමරුම් උත්සවය පැවති වසංගත තත්ත්වය හේතුවෙන් මූලිකව මාර්ගගත ක්‍රමයට සිදු කෙරිණි. සමගිය සහ මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම උදෙසා බහුත්ව වාදය, අන්තඃකරණය සහ බහු සංස්කෘතිකවාදය පිළිබඳ අදහස් ප්‍රවර්ධනය කරමින් "මිත්‍රත්වය සඳහා භාෂාව" යන්න මෙවර එහි තේමාව විය. මෙම සැමරුම් උත්සවය පාසල් සිසුන් සඳහා වූ ක්‍රියාකාරකම් රැසකින් සමන්විත විය. මෙම අවස්ථාව සඳහා අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා වීඩියෝ පණිවුඩයක් නිකුත් කරන ලදී.

- චීන කොමියුනිස්ට් පක්ෂයේ 100 වන සංවත්සරයට මාර්ගගතව සහභාගී වීම සහ දේශනයක් පැවැත්වීම - 2021 ජූලි 6

  චීන කොමියුනිස්ට් පක්ෂයේ (CPC) 100 වැනි සංවත්සරය නිමිත්තෙන් පැවැත්වූ මාර්ගගත වැඩසටහනට අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා සහභාගී වන ලදී. බීජිංහිදී පැවති මෙම උත්සවයට චීන ජනාධිපති ෂී ජින්පින් මැතිතුමා සහ චීන

කොමියුනිස්ට් පක්ෂයේ (CPC) මුලිකත්වයෙන් පැවැත්වූ අතර අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් මෙහිදී ආරාධිත දේශනයක් පවත්වන ලදී.

- ආසියා පැසිෆික් කලාපීය පළමු ලෝක සාගර සමුළුවේ ප්‍රධාන දේශනය පැවැත්වීම 2021 දෙසැම්බර් 6-10

ආර්ථික විද්‍යාඥයින් විසින් සංවිධානය කරන ලද ආසියා පැසිෆික් කලාපීය පළමු ලෝක සාගර සමුළුවෙහි ප්‍රධාන දේශකයෙකු වශයෙන් සහභාගී වන ලෙසට අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට කර තිබූ ආරාධනාවට අනුව එම සමුළුවේ ප්‍රධාන දේශනය සඳහා සහභාගී වූ අතර, මාර්ගගත වැඩසටහන සඳහා දේශකයින් 100 ක් සහ සහභාගීවන්නන් 2,000 ක් පමණ සහභාගී විය .

අනුමත කළේ,



අනුර දිසානායක
අග්‍රාමාත්‍ය ලේකම්

03. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසිඒ-එල්

අග්‍රාමාත්‍ය කාර්යාලය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	කක්‍ය 2021 රු.	නැවත ගලපන 2020 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,609,800,000	891,974,000	ඒසිඒ-3
-	කැන්පතු		9,528,160	12,608,604	ඒසිඒ-4
-	අක්තිකාරම් ගිණුම්		22,307,813	34,839,255	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		1,641,635,973	939,421,859	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		1,641,635,973	939,421,859	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		1,641,635,973	939,421,859	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
446,042,500	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	443,471,743	342,173,361	
800,395,500	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	796,361,272	491,449,024	ඒසිඒ-2(ii)
2,312,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	2,311,965	2,223,520	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,248,750,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		1,242,144,980	835,845,905	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	334,623,707	43,705,833	
349,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	84,028,905	22,834,290	
96,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
-	හැකියා වර්ධනය	14	923,732	899,460	
2,000,000	වෙනත් මූලධන වියදම්	15	-	-	
-	මුළු මූලධන වියදම් (උ)		419,576,344	67,439,583	
447,500,000					
	කැන්පතු ගෙවීම්		35,666,688	12,429,746	ඒසිඒ-4
	අක්තිකාරම් ගෙවීම්		30,715,005	38,173,189	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		66,381,693	50,602,935	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,728,103,017	953,888,423	
1,696,250,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(86,467,044)	(14,466,565)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(86,467,044)	(14,466,565)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		ඒසිඒ-3
			(86,467,044)	(14,466,565)	

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

අග්‍රාමාත්‍ය කාර්යාලය
2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021 රු.	කත්‍ය 2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	19,983,883,399	19,899,854,495
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	59,633,480	51,226,288
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		20,043,516,880	19,951,080,783
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		53,944,207	19,398,487
දේපළ පිරියත හා උපකරණ සංචිතය		19,983,883,399	19,899,854,495
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රංශම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	5,689,274	31,827,802
අවශේෂ	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		20,043,516,880	19,951,080,783

පිටු අංක 07 සිට 25 දක්වා ඒසිඒ 2 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 26 සිට 35 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විශ්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන නිකුත්කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය : එම්.එම්.පේ.ආර්.එන්. ප්‍රනාන්දු ප්‍රධාන ගණකාධිකාරි අග්‍රාමාත්‍ය කාර්යාලය 58, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවත කොළඹ 07
දිනය :	අතුරු දිසානායක අග්‍රාමාත්‍ය ලේකම් අග්‍රාමාත්‍ය කාර්යාලය 58, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.	
අතුරු දිසානායක අග්‍රාමාත්‍ය ලේකම් අග්‍රාමාත්‍ය කාර්යාලය ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවත, 07.		

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

අග්‍රාමාත්‍ය කාර්යාලය
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය 2021 රු.	නැවත ගලපන 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	41,317,445	11,570,319
අග්‍රිම ලැබීම්	1,609,800,000	891,974,000
අත්තිකාරම් අයකර ගැනීම්	27,486,819	36,435,255
තැන්පතු ලැබීම්	9,528,160	12,608,604
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,688,132,424**	**952,588,178**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,195,481,432	827,475,393
සහනාධාර සහ මාරුකිරීම්	2,311,965	2,223,520
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	5,689,345	5,373,182
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	29,406,652	37,646,754
තැන්පතු ගෙවීම්	35,666,688	12,429,746
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,268,556,081**	**885,148,595**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**419,576,344**	**67,439,583**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	419,576,344	67,439,583
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**419,576,344**	**67,439,583**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(419,576,344)**	**(67,439,583)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	**0.0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

04 . ආයතනයේ කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම අනුව)

ප්‍රධාන ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	දර්ශකය	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)		
			100%-90%	75%-89%	50%-74%
ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, ඒවා ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම	සෞභාග්‍යයේ දැක්ම රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වන සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා රැස්වීම් පැවැත්වීම, ඒවා සම්බන්ධීකරණය, හා අවශ්‍ය උපදෙස් ලබාදීම	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව සහ පසු විපරම් කරන ලද තීරණ සංඛ්‍යාව	✓		
	කාර්යක්ෂම හා ඵලදායීව සෞභාග්‍යයේ දැක්ම හා තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා බිම් මට්ටමේ පවතින සංවර්ධන ගැටලු හා අවශ්‍යතාවයන් හඳුනා ගැනීමටත්, පිළියම් යෙදීමටත් සුදුසු රාජ්‍ය යාන්ත්‍රණයක් ඇති කිරීම	ඉටු කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව	✓		
	ජාතික හෝ උප ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන මහා පරිමාණ සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය, මහපෙන්වීම හා පහසුකම් සැපයීම	ඉටු කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව	✓		
	කාලීනව පැන නගින ජාතික අවශ්‍යතාවයන් හා හදිසි අවශ්‍යතාවයන් හෝ ආපදාවන් වැනි අවස්ථාවන්හි දී අවශ්‍ය සම්බන්ධීකරණය, පහසුකම් සැපයීම හා අදාළ ප්‍රතිපත්තිමය මැදිහත්වීම	ඉටු කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව	✓		

ප්‍රධාන ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	දර්ශකය	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)		
			100%-90%	75%-89%	50%-74%
	පවතින ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම දී අවශ්‍ය සම්බන්ධීකරණය ලබාදීම	සමාලෝචනයට හා ඇගයීමට ලක් කරන ලද ජාතික ප්‍රතිපත්ති සංඛ්‍යාව		✓	
	ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සමාලෝචනය හා ඇගයීම	ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව		✓	
	ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල සටහන් පිළියෙල කිරීම, ඒවා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සහ පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම	ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් සංඛ්‍යාව පිළිතුරු සපයන ලද පාර්ලිමේන්තු ප්‍රශ්න සංඛ්‍යාව	✓		
ආගමික කටයුතු සහ සමාජ සුබසාධනය	ජාතික / ආගමික උත්සව සහ සමාජ සත්කාරක සේවාවන්ට අදාළ කටයුතු සම්බන්ධීකරණය	සම්බන්ධීකරණය කරන ලද ජාතික / ආගමික උත්සව සහ සමාජ සත්කාරක සේවාවන් සංඛ්‍යාව	✓		
	ගරු අග්‍රාමාත්‍යතුමා වෙත ලැබෙන මහජන පැමිණිලි හා දුක් ගැනවිලි වලට අදාළ කටයුතු සම්බන්ධීකරණය	ලැබුණු හා පිළිතුරු සපයන ලද මහජන පැමිණිලි සහ දුක්ගැනවිලි සංඛ්‍යාව	✓		
ජාත්‍යන්තර සහයෝගීතාවය	විදේශීය දූත මණ්ඩල හා විදේශීය තානාපති සේවයේ නිලධාරින් සමඟ සම්බන්ධතා වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය	විදේශීය දූත මණ්ඩල හා විදේශීය තානාපති සේවයේ නිලධාරින් සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම යවන ලද / ලැබුණ සන්නිවේදන සංඛ්‍යාව	✓		
	ජාත්‍යන්තර සමුළු සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහභාගිත්වයට අදාළ කටයුතු සම්බන්ධීකරණය	ගරු අග්‍රාමාත්‍යතුමා සහභාගි වූ ජාත්‍යන්තර සමුළු සංඛ්‍යාව	✓		

ප්‍රධාන ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	දර්ශකය	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)		
			100%-90%	75%-89%	50%-74%
නීතිමය කටයුතු	නීති කෙටුම්පත් සංශෝධන, සමාලෝචනය සහ අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම	නීති කෙටුම්පත් සංශෝධන සම්බන්ධයෙන් ඉදිරිපත් කළ සමාලෝචන හා නිර්දේශ වාර්තා සංඛ්‍යාව	✓		
	උසාවී නඩුවලට අදාළව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කිරීම	නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කරන ලද නඩු සංඛ්‍යාව	✓		
විධිමත් හා යහපත් ආයතනික ක්‍රියාකාරකම්	2020 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සකස් කිරීම	2020 කාර්යසාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරීම	✓		
	2021 වර්ෂයේ ප්‍රගති වාර්තාව සකස් කිරීම	2021 ප්‍රගති වාර්තාව නියමිත දිනයේදි ඉදිරිපත් කිරීම	✓		
	2022 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	2022 ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනයේදි ඉදිරිපත් කිරීම	✓		
	2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	2022 ප්‍රසම්පාදන සැලැස්ම නියමිත දිනයේදි ඉදිරිපත් කිරීම	✓		
	2020 වර්ෂය සඳහා විසර්ජන ගිණුම සකස් කිරීම	2020 විසර්ජන ගිණුම නියමිත දිනයේදි ඉදිරිපත් කිරීම	✓		
	2022 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම	2022 අයවැය ඇස්තමේන්තුව නියමිත දිනයේදි ඉදිරිපත් කිරීම	✓		

ප්‍රධාන ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	දර්ශකය	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)		
			100%-90%	75%-89%	50%-74%
	විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	ලැබුණු හා පිළිතුරු සපයන ලද විගණන විමසුම් සංඛ්‍යාව	✓		
	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම	පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව	✓		
	අභ්‍යන්තර විගණන වාර්තා සකස් කිරීම	සකස් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සංඛ්‍යාව	✓		
	2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම	2022 අභ්‍යන්තර විගණන සැලසුම නියමිත දිනට ඉදිරිපත් කිරීම	✓		
ධාරිතා සංවර්ධනය	නිලධාරීන්ගේ දේශීය හා විදේශීය පුහුණුවීම් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය	අවසන් කළ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සංඛ්‍යාව/ සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව			✓
	කාර්යාලය සඳහා ඵලදායීතා සංකල්පය හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම	පුහුණු වැඩසටහන් සංඛ්‍යාව/ සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව		✓	
මහජන අදහස් සහ තොරතුරු සන්නිවේදනය හා ප්‍රචාරණය	රාජ්‍ය/ජාතික උත්සව හා විශේෂ අවස්ථාවන් සඳහා මාධ්‍ය ආවරණය සැපයීම සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය	මාධ්‍ය ආවරණය කරන ලද රාජ්‍ය/ජාතික උත්සව හා විශේෂ අවස්ථාවන් සංඛ්‍යාව	✓		

ප්‍රධාන ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	දර්ශකය	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)		
			100%-90%	75%-89%	50%-74%
ආයතනික කළමනාකරණය සහ සංවර්ධනය	කාර්යාලය සඳහා කාර්යාලයීය උපකරණ සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම	ඉටුකරන ලද ප්‍රසම්පාදන කාර්යන් සංඛ්‍යාව මිලදී ගන්නා ලද කාර්යාලයීය උපකරණ සහ ගෘහ භාණ්ඩ සංඛ්‍යාව		✓	
	කාර්යාලයේ ගොඩනැගිලි ඉදි කිරීම, නවීකරණය සහ නඩත්තු කිරීම	ඉටුකරන ලද ප්‍රසම්පාදන කාර්යන් සංඛ්‍යාව ඉදි කරන ලද, නවීකරණය සහ නඩත්තු කරන ලද කාර්යාලයේ ගොඩනැගිලි සංඛ්‍යාව හා ඒවායේ වටිනාකම	✓		
	කාර්යාලය සඳහා යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා වාහන මිලදී ගැනීම හා නඩත්තුව	ඉටුකරන ලද ප්‍රසම්පාදන කාර්යන් සංඛ්‍යාව මිලදී ගත් හා නඩත්තු කරන ලද යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා වාහන සංඛ්‍යාව හා එහි වටිනාකම			✓
ඩිජිටල්කරණය	කාර්යාලයීය වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා ගැනීම	යාවත්කාලීන කරන ලද කාර්යාලයීය වෙබ් අඩවිය	✓		
	ආරක්ෂිත පරිසරයක් තුළ අන්තර්ජාල හා ඊ-මේල් පහසුකම් සැපයීම	ආරක්ෂිත පරිසරයක් තුළ සපයන ලද අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් පහසුකම්	✓		

ප්‍රධාන ක්ෂේත්‍රය	ක්‍රියාකාරකම	දර්ශකය	සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%)		
			100%-90%	75%-89%	50%-74%
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම	සම්බන්ධීකරණය කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති සංඛ්‍යාව		✓	
	ජාල පද්ධතිය හා සර්වර් නඩත්තු කිරීම	ජාල පද්ධතිය හා සර්වර් නිසි පරිදි අඛණ්ඩව ක්‍රියාත්මක වීම	✓		
	අභ්‍යන්තර කටයුතු සඳහා අවශ්‍ය මෘදුකාංග නිපදවීම හා පවතින මෘදුකාංග වැඩිදියුණු කිරීම	නිපදවන ලද හා වැඩිදියුණු කරන ලද මෘදුකාංග සංඛ්‍යාව		✓	

05. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධන දර්ශක

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටු කළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 - 49%	50 -74%	75 -100%
01	සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම **(1)**	1.2	1.2.2	01	ජනතාවගේ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා දරිද්‍රතාවයේ සියලු මානයන්ට අදාළ සියලු වයස් කාණ්ඩයන්ට අයත් ජනතාවට සහන සැලසීම උදෙසා අවශ්‍ය උපදෙස් ලබා දීම.			√
02	සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම **(2)**	2.1 2.ඇ. 2.4	2.1.2 2.ඇ.1 2.4.1	01	ජනතාවගේ ජීවන වියදම අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.			√
				01	කාබනික පොහොර භාවිතා කර ඵලදායී හා තිරසර කෘෂිකර්ම කටයුතු සිදු කිරීම පිළිබඳ උපදෙස් හා මග පෙන්වීම ලබා දීම.			√

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටු කළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 - 49%	50 -74%	75 -100%
		2.1 2.ඇ.	2.1.1 2.ඇ.1	01	සහල් මිල උච්චාවචනය වීම වැලැක්වීම හා ප්‍රමාණවත් පරිදි වසර පුරා ලබා ගැනීමට හැකිවන පරිදි සහල් සංචිත පවත්වා ගැනීම සම්බන්ධ උපදෙස් ලබා දීම.			√
03	නිරෝගී ජීවිත සහතික කර, සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම. **(3)**	3.ඈ	3.ඈ.1	03	සාමාන්‍ය ජනතාවට අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සේවා පහසුකම් ලබාගැනීමට හැකිවන අයුරින් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා, රෝහල් වැඩිදියුණු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.			√
		3.8 3.ආ	3.8.1 3.ආ.1	02	ශ්‍රී ලංකාවේ කොවිඩ් වසංගත තත්ත්වය පාලනය කිරීම, එයට සාර්ථකව මුහුණ දීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම හා ඒ සඳහා පහසුකම් සැලසීම.			√
		3.ආ	3.ආ.1	01	ශ්‍රී ලාංකික දරුවන්ගේ පාසල් අධ්‍යාපන කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා පාසල් ළමුන් හා ගුරුවරුන් එන්නත් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.			√

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටු කළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 - 49%	50 -74%	75 -100%
04	පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම. **(4)**	4.1 4.6	4.1.1 4.6.1	02	"බසයෙන් අනාගතයට" බස් රථ පුස්තකාල වැඩසටහන හඳුන්වා දීමට අදාළ උපදෙස් හා මගපෙන්වීම ලබා දීම.			√
		4.2	4.2.1	02	පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම උදෙසා අවශ්‍ය සියලු කටයුතු සම්පාදනයට උපදෙස් ලබා දීම.			√
		4.3	4.3.1	02	ගුණාත්මක තෘතියික අධ්‍යාපනයක් ලබා දීමට අවශ්‍ය පහසුකම් විශ්ව විද්‍යාල වෙත ලබා දීමට කටයුතු සම්පාදනය කිරීම.			√
		4.අ	4.අ.1	01	දුෂ්කර ප්‍රදේශවල පිහිටි පිරිවෙන්වල ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට, සිල් මාතාවන්ට හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඵලදායී ඉගෙනුම් වාතාවරණයක් ලබාදීමට අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කිරීම.			√

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටු කළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 – 49%	50 -74%	75 -100%
05	සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම **(6)**	6.1 6.3	6.1.1 6.3.2	01	ගුණාත්මකභාවයෙන් යුක්ත ජලය සහිත ජලාශ ප්‍රමාණය ඉහළ නැංවීම උදෙසා කටයුතු කිරීම.			√
		6.1.1	6.1.1	07	සුරක්ෂිත පානීය ජල සැපයුම් සේවා පරිභෝජනය කරන ජනගහනයේ ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා සුවිසල් ජල යෝජනා ක්‍රම හා ජල පවිත්‍ර ව්‍යාපෘති ජනතා අයිතියට පත් කිරීම.			√
06	සියල්ලන් සඳහා දැරියහැකි, විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම **(7)**	7.අ 7.1	7.අ.1 7.1.1	03	බණිජ තෙල් නිෂ්පාදන ක්ෂේත්‍රයේ පවතින ගැටලු නිරාකරණය කිරීමට හා එම ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය මැදිහත්වීම හා උපදෙස් ලබාදීම.			√
		7.1	7.1.1	02	සියළුම ශ්‍රී ලාංකික ජනතාවට විදුලි බලය ලබා දීමට අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම ලබා දීම.			√

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටු කළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 – 49%	50 -74%	75 -100%
07	සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. **(8)**	8.1	8.1.1	04	වර්තමාන ආර්ථික තත්ත්වය නඟාසිටුවීම සඳහා ඒක පුද්ගල ආර්ථික නිෂ්පාදනය වර්ධනයට අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.			√
		8.3	8.3.1	02	යහපත් රැකියා ප්‍රවර්ධනය අරමුණු කොට ගෙන ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධනය සඳහා අවශ්‍ය මග පෙන්වීම හා උපදෙස් ලබා දීම.			√
		8.3	8.3.1	05	දේශීය රෙදිපිළි නිෂ්පාදකයන් දිරි ගැන්වීම උදෙසා මග පෙන්වීම හා දිරි දීමනා ලබා දීම.			√
		8.5	8.5.1	01	යහපත් රැකියා ප්‍රවර්ධනය අරමුණු කොට සියලුම කාන්තා හා පිරිමින් සඳහා රැකියා ලබා දීමට, වෘත්තිය පුහුණුව ලබා දීම පිළිබඳ සාකච්ඡා හා මග පෙන්වීම් ලබා දීම.			√
		8.5	8.5.2	62	සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනයක් ලබා දීම උදෙසා ග්‍රාමීය ආර්ථිකය නඟාසිටුවීමේ ජාතික වැඩසටහන දියත් කිරීම.			√

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටු කළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 – 49%	50 -74%	75 -100%
		8.9	8.9.2	01	දේශීය සිනමා කර්මාන්තය ආශ්‍රිත රැකියා ප්‍රවර්ධනය සඳහා එම කර්මාන්තයේ පවතින ගැටලුවිසඳීමට මග පෙන්වීම ලබා දීම.			√
		8.10	8.10.2	06	සියලු දෙනාට බැංකු හා රක්ෂණ පහසුකම් සඳහා ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය කටයුතු දියත් කිරීමට මග පෙන්වීම ලබා දීම.			√
08	සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිමත් කිරීම **(9)**	9.1	9.1.1 9.1.2	06	සියලු දෙනාට තිරසර, ගුණාත්මක හා සවිමත් යටිතල පහසුකම් ලබාදීම අරමුණු කොට ප්‍රාදේශීය, නාගරික මාර්ග හා අධිවේගී මාර්ග සංවර්ධනය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම ලබා දීම.			√
		9.2	9.2.2	02	ජාතික තත්ත්වයන්ට අනුකූල රැකියාවන් සැපයීම ඉහළ දැමීම මඟින් සමස්ත සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වර්ධනය කිරීම සඳහා අවධානය යොමු කිරීම.			√
		9.3	9.3.2	01	දේශීය කර්මාන්තකරුවන් නගා සිටුවීම උදෙසා කළ හැකි ක්‍රියාකාරකම් පිළිබඳ උපදෙස් ලබා දීම.			√

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටු කළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 - 49%	50 -74%	75 -100%
09	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම **(11)**	11.1	11.1.1	03	"සැමට නිවාස" ලබාදීමේ වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබාදීම.			√
		11.3	11.3.2	09	විධිමත් නගර සැලසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව උපදෙස් ලබා දීම හා මග පෙන්වීම.			√
10	තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම. **(12)**	12.2	12.2.2	01	ස්වභාවික සම්පත් කාර්යක්ෂම අන්දමින් භාවිතා කිරීම හා දේශීය භාණ්ඩ පරිභෝජනය ඉහළ නැංවීම උදෙසා මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදනය හා සම්බන්ධ ගැටලු නිරාකරණයට අවශ්‍ය උපදෙස් ලබාදීම.			√
11	දේශගුණික විපර්යාස සහ ඒවයේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම. **(13)**	13.1	13.1.3	01	ශ්‍රී ලංකාවේ ජලගැලීම් වලට ලක් වන පහත් බිම්වල ජීවත් වන ජනතාවට කඩිනම් විසඳුම් ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය.			√

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටු කළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 - 49%	50 -74%	75 -100%
12	තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය. **(14)**	14.1 14.2	14.1.1 14.2.1	01	X-press pearl නෞකාවේ අනතුරු හේතුවෙන් ශ්‍රී ලාංකීය සාගරික කලාපයට සිදුව ඇති හානිය සඳහා වන්දි අයකර ගැනීම සඳහා උපදෙස් ලබා දීම.			√
		14.1	14.1.1	02	ගොඩබිම පදනම් කරගත් ක්‍රියාකාරකම් මඟින් සිදුවන සියලුම ආකාරයේ සමුද්‍ර දූෂණය වැලැක්වීම උදෙසා වෙරළ පිරිසිදු කිරීම සම්බන්ධ කටයුතු සඳහා උපදෙස් ලබා දීම.			√
13	භූගෝලීය පරිසර පද්ධතින්ගේ තිරසාර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවත්වීම. **(15)**	15.5	15.5.1	01	වනජීවීන්ගේ ස්වභාවික වාස භූමි ආරක්ෂා කිරීම සහ වන අලි - මිනිස් ගැටුම පාලනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.			√

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටු කළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 – 49%	50 -74%	75 -100%
14	තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම. **(16)**	16.6	16.6.1	08	නියමිත ක්‍රමවේදයන්ට අනුව හා අදාළ කාල රාමුව තුළ මුල්‍ය, කාර්යසාධන, ප්‍රගති, ප්‍රසම්පාදන සැලසුම ඇතුළු අනෙකුත් වාර්තා සකස් කිරීම.			√
		16.3	16.3.1	113,152	සාධාරණ හා යුක්තිගරුක සමාජයක් බිහිකිරීම අරමුණුකොට මහජන ගැටලු/ දුක් ගැනවිලි කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම (මහජන සම්බන්ධතා අංශය - ලිපි, ෆැක්ස්, විද්‍යුත් තැපැල් පණිවුඩ, මහජන හමුවීම් මඟින් පැමිණෙන ගැටලු විසඳීමට සහය වීම)			√
		16.3	16.3.2	01	සියලු දෙනාට නීතියේ සාධාරණත්වය ලබාගැනීම අරමුණු කොට බන්ධනාගාර තුළ තදබදය අවම කිරීම සඳහා හොරණ මිල්ලනියේ නව බන්ධනාගාර සංකීර්ණයක් ප්‍රතිස්ථාපනයට අවශ්‍ය මගපෙන්වීම ලබාදීම.			√
		16.6	16.6.1	07	රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ සාකච්ඡා කිරීම.			√

#	තිරසර සංවර්ධන අරමුණ	ඉලක්ක	දර්ශක	ඉටු කළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව	ක්‍රියාකාරකම්	සත්‍ය නිමැවුම		
						0 – 49%	50 -74%	75 -100%
15	ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගිතාවයේ පුනර්ජීවනය. **(17)**	17.9	17.9.1	03	ශ්‍රී ලංකාවේ තිරසර අරමුණු ක්‍රියාවට නැංවීම සඳහා ලබාදෙන අන්තර්ජාතික සහයෝගීතාව වැඩිදියුණු කිරීම සඳහා සහෝදර රටවල් සමඟ එක්ව කටයුතු කිරීම.			√
		17.5 17.11	17.5.1 17.11.1	01	ඇහලුම් කර්මාන්ත හා වෙළඳ ක්ෂේත්‍රයට බලපාන ප්‍රතිපත්තිමය හා නෛතික කරුණු පිළිබඳ පූර්ව අධ්‍යනය කමිටුව සමඟ සාකච්ඡා කිරීම.			√
		17.19	17.19.2	01	තිරසර සංවර්ධනයේ ප්‍රගතිය මැනීමට මිණුම් සංවර්ධනය කිරීම හා දිවයිනේ සංඛ්‍යාන ධාරිතාවන් ගොඩනැංවීම අරමුණුකොට උප්පැන්න, මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් සංගමය සමඟ සාකච්ඡා කිරීම.			√
16	සියලුම තිරසර සංවර්ධන අරමුණු			03	තිරසර සංවර්ධන අරමුණු සඳහා වන මෙහෙයුම් කමිටු සංවිධානය, අදාළ සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනය සිදු කිරීම.			√

5.2. තිරසර සංවර්ධන අරමුණ ළඟා කර ගැනීම සඳහා ඉලක්ක හා දර්ශක විස්තරාත්මකව හඳුනාගැනීම

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
1.2		ජාතික මට්ටමේ අර්ථ නිරූපනවලට අනුකූලවන පරිදි සියලුම ආකාරයේ දරිද්‍රතාවයන්ගෙන් පෙළෙන සියලුම වයස් කාණ්ඩවලට අයත් පිරිමින්, කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩුකිරීම.
	1.2.2	ජාතික නිර්වචනයන් වලට අනුව, දරිද්‍රතාවයේ සියලු මානයන්ට අදාළ තත්ත්වය තුළ ජීවත් වන සියලු වයස් කාණ්ඩයන්ට අයත් ස්ත්‍රී, පුරුෂ සහ ළමා ජනගහනයේ ප්‍රමාණය.
2.1		2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක් වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබාගැනීමට හැකි බව තහවුරු කිරීම.
	2.1.2	ආහාර අනාරක්ෂිතතා අත්විඳීම් දර්ශකය පදනම් කර ගනිමින් ජනගහනය තුළ මධ්‍යස්ථ හෝ තීව්‍ර ආහාර අනාරක්ෂිතභාවයේ ව්‍යාප්තිය.
2.ඇ		සීමාන්තික වශයෙන් ආහාර මිල උච්ඡාවචනය වීම වැලැක්වීමට ආහාර සංචිත ද ඇතුළත්ව ආහාර නිෂ්පාදන වෙළෙඳපොලවල් සහ ඒවායේ අතුරු නිෂ්පාදන නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
	2.ඇ.1	ආහාර මිල අසමානතා දර්ශකය
2.4		2030 වනවිට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ , කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවයන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාලගුණ තත්ත්වයන්, නියඟ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්න වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම
	2.4.1	ඵලදායි සහ තිරසර කෘෂිකර්මය සිදුකරන කෘෂිකාර්මික භූමි ප්‍රමාණය
3.ඈ		විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල් ඇතුළුව සියලුම රටවල ජාතික මට්ටමේ සහ විශ්වීය මට්ටමේ සෞඛ්‍ය අවදානම් සඳහා පූර්ව දැනුම් දීමේ, අවධානම් අවම කිරීමේ සහ කළමනාකරණ කිරීමේ ධාරිතාවන් ශක්තිමත් කිරීම.
	3.ඈ.1	අන්තර්ජාතික සෞඛ්‍ය නියමයන් සඳහා වන ධාරිතාව සහ හදිසි සෞඛ්‍ය අවස්ථාවක් සඳහා වන සුදානම
3.8		මූල්‍යමය අවධානයට පත්වීම සඳහා ආරක්ෂණය ද ඇතුළත්ව ආරක්ෂාකාරී, ඵලදායි, ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු වියදමකින් ලබාගත හැකි ඖෂධ, එන්නත් හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියලු දෙනාටම ලබාගත හැකි වීම ඇතුළුව විශ්වීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට හැකි වීම
	3.8.1	අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා ආවරණය (සාමාන්‍ය ජනතාව සහ වඩාත් පහසුකම් අඩු ජනගහණයන් අතර ප්‍රජනන, මාතෘ, ළදරු, ළමා, සෞඛ්‍ය, බෝවන රෝග, බෝ නොවන රෝග සහ සේවා පහසුකම් සඳහා වන සුලභතාවය ලෙස අර්ථ දැක්වේ.)

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
3.ආ		මූලික වශයෙන් සංවර්ධනය වෙමින් පවත්නා රටවලට බලපාන්නා වූ බෝ වන සහ බෝ නොවන රෝග සඳහා අවශ්‍ය එන්නත් හා ඖෂධ නිපදවීම සඳහා වූ පර්යේෂණ වලට සහය ලබා දීම, අත්‍යාවශ්‍ය ඖෂධ සහ එන්නත් ලබා ගැනීමට අවස්ථාව සැලසීම, දෝහා ප්‍රකාශනයේ දැක්වෙන ඔසෘෂජී එකඟතාවයට අනුව දියුණු වෙමින් පවතින රටවලට මහජන සෞඛ්‍ය ආරක්ෂාකර ගැනීම සම්බන්ධයෙන් පියවර ගැනීමේදී විශේෂයෙන්ම සියලුදෙනාටම ඖෂධ ලබා ගැනීමට අවස්ථාව සැලසීම සඳහා වෙළඳාම සම්බන්ධයෙන් වූ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පිළිබඳව නම්‍යශීලීව කටයුතු කිරීමේ අයිතිවාසිකම පූර්ණ වශයෙන් යොදා ගැනීම.
	3.ආ.1	සිය ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන තුළට අන්තර්ගත සියලු එන්නත් මගින් ආවරණය කෙරෙන ඉලක්කගත ජනගහනයේ ප්‍රමාණය.
4.1		2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකි වන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම.
	4.1.1	ස්ත්‍රී පුරුෂභාවය අනුව (අ) 2/3 ශ්‍රේණිවල, (ආ) ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ සහ (ඇ) පහළ ද්විතියික මට්ටම් වල ඉගෙනුම ලබන දරුවන් සහ යෞවනයන් අතර I. කියවීමට සහ II. ගණිතමය කුසලතාවය සඳහා වන අවම මට්ටම සහිත අයගේ ප්‍රමාණය.
4.2		2030 වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම.
	4.2.1	ස්ත්‍රී පුරුෂභාවය අනුව සෞඛ්‍යමය, ඉගෙනුම් සහ මනෝවිද්‍යාත්මක අංශයන්ගෙන් යහපත් සංවර්ධන මාර්ගයකට අවතීර්ණව සිටින වයස අවු: 5 ට අඩු ළමුන්ගේ ප්‍රමාණය.
4.3		2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබාගත

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
		හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතියික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම
	4.3.1	ස්ත්‍රී පුරුෂභාවයට අනුව පූර්ව මාස 12 තුළ විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ සහ වැඩිහිටියන්ගේ සහභාගීත්ව අනුපාතය.
4.6		2030 වන විට සියලුම තරුණ තරුණියන්, කාන්තා, පිරිමි, වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව ලබා සිටීම.
	4.6.1	ස්ත්‍රී පුරුෂභාවය අනුව කිසියම් වයස් කාණ්ඩයකට අදාළව අවම (අ) සාක්ෂරතා (ආ) සංඛ්‍යාමය කාර්ය කුසලතාවක් අත්කරගෙන සිටින ජනගහනයේ ප්‍රමාණය
4.අ		ළමුන්, ආබාධිත පුද්ගලයින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී ආකාරයට අධ්‍යාපන පහසුකම් ගොඩනැංවීම, වැඩිදියුණු කිරීම සහ සියලුම දෙනාට ආරක්ෂාකාරී, ප්‍රචණ්ඩත්වයෙන් තොර, සියලුදෙනා අන්තර්ගතකරණය වූ සහ ඵලදායී ඉගෙනීම් වාතාවරණයන් තහවුරු කර දීම.
	4.අ.1	(අ) විදුලිය (ආ) ඉගැන්වීමේ පහසුකම් පිණිස අන්තර්ජාලය භාවිතය (ඇ) ඉගැන්වීමේ පහසුකම් පිණිස පරිගණක භාවිතය (ඈ) ආබාධ සහිත දරුවන් සඳහා විශේෂිත වූ යටිතල පහසුකම් සහ උපකරණ (ඉ) මූලික පානීය ජල පහසුකම (ඊ) ස්ත්‍රී / පුරුෂ භාවය අනුව වෙන්කරන ලද ස්වස්ථතා පහසුකම් (උ) මූලික අත්සේදීමේ පහසුකම් (WASH දර්ශකයේ නිර්වචන අනුව) යන ප්‍රවේශයන් සහිත පාසල් ප්‍රමාණය.
6.1		2030 වන විට සියලුදෙනාට සමානාත්මතාවෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම.
	6.1.1	සුරක්ෂිත කළමනාකරණය කෙරෙන පානීය ජල සැපයුම් සේවා භාවිතා කරන ජනගහනයේ ප්‍රමාණය

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
6.3		2030 වන විට ජල දූෂණය අඩු කරමින් ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, හානිකර විෂ රසායනික සහ වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම සහ මුදා හැරීම තුරන් කිරීම, පිරිපහදු නොකරන ලද අපජලය මුදා හැරීම අඩු කිරීම සහ ජලය සැලකිය යුතු මට්ටමින් ප්‍රතිචක්‍රීයකරණය සහ ආරක්ෂාකාරීව නැවත භාවිතා කිරීම.
	6.3.2	ගුණාත්මක භාවයෙන් යුක්ත ජලය සහිත ජලාශ ප්‍රමාණය.
7.1		2030 වන විට සියලුදෙනාටම අඩු මිලකට ලබාගත හැකි විශ්වාසදායී නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශව විය හැකි බව තහවුරු කිරීම
	7.1.1	විදුලි සැපයුම සහිත ජනගහනයේ ප්‍රමාණය
7.අ		2030 වන විට පිරිසිදු බලශක්ති පර්යේෂණ සහ තාක්ෂණ, පුනර්ජනනීය බලශක්තියද ඇතුලත්ව බලශක්ති කාර්යක්ෂමතාව සහ උසස් සහ පිරිසිදු පොසිල ඉන්ධන තාක්ෂණය සහ බලශක්ති යටිතල පහසුකම් සහ පිරිසිදු බලශක්ති තාක්ෂණ සඳහා අන්තර්ජාතික සහයෝගීතාවය වැඩිදියුණු කිරීම.
	7.අ.1	පවිත්‍ර බලශක්තිය සම්බන්ධයෙන් වන පර්යේෂණ සහ සංවර්ධනය මෙන්ම ඒකාබද්ධ පද්ධතීන් ඇතුළු පුනර්ජනනීය බලශක්ති උත්පාදන සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙත ලැබෙන ජාත්‍යන්තර මූල්‍ය ගලායාම්.
8.1		ජාතික තත්ත්වයන්ට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධනය පවත්වාගෙන යාම සහ විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් වසරකට අවම වශයෙන් වසරකට 7% ක දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයක් පවත්වාගෙන යාම
	8.1.1	සත්‍ය ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනයේ වාර්ෂික වර්ධනය.

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
8.3		ඵලදායි ක්‍රියාකාරකම් වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලි භාවයට සහය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තීන් ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරි ගැන්වීම
	8.3.1	ස්ත්‍රී පුරුෂභාවය අනුව, කෘෂිකාර්මික නොවන සේවා නියුක්තයේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය
8.5		2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුලත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම.
	8.5.1	රැකියාව, වයස සහ ආබාධිත සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තිකයන්ගේ පැයක සාමාන්‍ය ආදායම් ඉපැයීම.
	8.5.2	ස්ත්‍රී පුරුෂභාවය, වයස සහ ආබාධිත සහිත පුද්ගලයන්ට අදාළව විරැකියා අනුපාතය.
8.9		2030 වන විට දේශීය සංස්කෘතිය, නිෂ්පාදනය හා රැකියා අවස්ථාවන් ප්‍රවර්ධනය කරන්නා වූ තිරසර සංචාරක කර්මාන්ත පිලිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
	8.9.2	සංචාරක ක්ෂේත්‍රයේ සමස්ත රැකියා ප්‍රමාණයෙන් තිරසර සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ රැකියා ප්‍රමාණය

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
8.10		සියලු දෙනාටම බැංකු පහසුකම් රක්ෂණ, සහ මුල්‍ය සේවාවන් ලබා ගැනීමට ප්‍රවේශ විය හැකි පරිදි දේශීය මුල්‍ය ආයතන වල ධාරිතාවන් ශක්තිමත් කිරීම
	8.10.2	බැංකුවක හෝ වෙනත් මූල්‍ය ආයතනයක නැතහොත් ජංගම මූල්‍ය සේවා සැපයුම් සේවාවක ගිණුමක් ඇති වැඩිහිටියන් (අවුරුදු 15 හෝ ඊට වැඩි) ප්‍රමාණය.
9.1		ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
	9.1.1	වසර පුරා භාවිත කළ හැකි මාර්ගයක සිට කි.මී. 2ක දුර ප්‍රමාණයක් ජීවත් වන ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණය
	9.1.2	ප්‍රවාහන මාධ්‍යය අනුව මගීන් සහ භාණ්ඩ ප්‍රමාණය.
9.2		සියලුදෙනාම අන්තර්ගත වන්නාවූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්ත්වයන්ට අනුකූල රැකියාවන් සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම.
	9.2.2	සමස්ත සේවා නියුක්තියේ අනුපාතයක් ලෙස නිෂ්පාදන අංශයේ සේවා නියුක්තිය.

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
9.3		විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල කුඩා පරිමාණ කර්මාන්ත සහ වෙනත් ව්‍යවසායන් සඳහා මූල්‍ය සේවාවන්, ණය ලබාගැනීමේ ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීම සහ එම ව්‍යවසායන් වටිනාකම් දාමයන්ට සහ වෙළඳපොළ දාමයන්ට ඒකාබද්ධ කිරීම.
	9.3.2	ණය හෝ ණය බැඳීම් සහිත කුඩා පරිමාණ කර්මාන්ත ප්‍රමාණය.
11.1		2030 වනවිට සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබාගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම
	11.1.1	පැල්පත්, අවිධිමත් ජනාවාස හෝ ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් යටතේ ජීවත්වන නාගරික ජනගහනයේ ප්‍රමාණය.
12.2		2030 වනවිට ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමනාකරණය කිරීම සහ කාර්යක්ෂමව භාවිතා කිරීම වෙත ලඟා වීම
	12.2.2	දේශීය භාණ්ඩ පරිභෝජනය, ඒක පුද්ගල දේශීය භාණ්ඩ පරිභෝජනය සහ දළ දේශීය නිෂ්පාදනයට අනුව දේශීය ද්‍රව්‍ය පරිභෝජනය.
13.1		සියලුම රටවල කාළගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තුදීමේ සහ එවැනි තත්ත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම.

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
	13.1.3	ජාතික ආපදා අවම කිරීමේ ක්‍රමෝපායන්ට සමාන්තරව ප්‍රාදේශීය ආපදා අවම කිරීමේ ක්‍රමෝපායන් යොදාගෙන එය ක්‍රියාවට නංවා ඇති පළාත් පාලන කරන ආයතන ප්‍රමාණය.
14.1		2025 වන විට සමුද්‍රීය අපද්‍රව්‍ය සහ පෝෂක දූෂණය වීම ද ඇතුළුව විශේෂයෙන්ම ගොඩබිම් පදනම් කරගත් ක්‍රියාකාරකම් මඟින් සිදුවන සියලුම ආකාරයේ සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සැලකිය යුතු මට්ටමින් අවම කිරීම.
	14.1.1	වෙරළාසන්න සුපෝෂණ සහ පාවෙන ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඝනත්වය.
14.2		2020 වන විට ආපදාවන්ට ඔරොත්තු දීමට සවිබල ගන්වමින් සහ සෞඛ්‍යවත් සහ ඵලදායිතාවයෙන් යුක්ත වන ආකාරයට සාගර යථා තත්ත්වයට පත් කරමින් සමුද්‍රීය සහ වෙරළබඩ පරිසර පද්ධති තිරසාර අන්දමින් කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම.
	14.2.1	පරිසර පද්ධති පාදක ප්‍රවේශය භාවිතයෙන් කළමනාකරණය කෙරෙන විශේෂ ආර්ථික කලාප ප්‍රමාණය.
15.5		ස්වභාවික වාසභූමි විනාශ වීම අවම කිරීමට කඩිනම් සහ කැපී පෙනෙන ක්‍රියාමාර්ග ගැනීම, ජෛව විවිධත්වයට හානි වීම නැවැත්වීම සහ 2020 වන විට තර්ජනයට ලක් වූ ජීවී විශේෂයන් ආරක්ෂා කිරීම සහ වඳවීයාම වැළැක්වීම.
	15.5.1	රතු ලැයිස්තු දර්ශකය.

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
16.3		සියලුම දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකි වීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම.
	16.3.1	පසුගිය මාස 12ක කාලය තුළ හිංසනයට ලක් වූ අය අතරින් නිසි බලධාරීන්ගේ නිල වශයෙන් පිළිගත් ගැටුම් සමථකරණ යාන්ත්‍රණයක් වෙත වාර්තා කරන ලද හිංසනයට ලක් වූ පුද්ගලයින් ප්‍රමාණයන්
	16.3.2	සමස්ත සිරකරුවන් සංඛ්‍යාවෙන් දඬුවම් නියම නොකළ රැඳවියන් ප්‍රමාණය.
16.6		සියලුම මට්ටම්වලදී ඵලදායී වගවීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන් යුත් ආයතන පිහිටුවීම
	16.6.1	ප්‍රධාන රාජ්‍ය වියදම් අංශයන් අනුව (නැතහොත් අයවැය කේතයන් හෝ සමාන) මූලික අනුමත අයවැයෙන් පංගුවක් ලෙස
17.5		අවම වශයෙන් සංවර්ධනය වන රටවල ආයෝජන ප්‍රවර්ධන කලාප යොදාගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
	17.5.1	ඌන සංවර්ධිත රටවල් සඳහා ආයෝජන ප්‍රවර්ධන යොදාගෙන ඇති සහ ක්‍රියාත්මක කරන රටවල් සංඛ්‍යාව.
17.9		උතුරු - දකුණු , දකුණු - දකුණු ත්‍රිකෝණාත්මක සහයෝගිතාවය හරහා සංවර්ධනය වෙමින් පවතින රටවලට තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාවට නැංවීමට ජාතික සැලසුම් සැකසීම සහ ඵලදායී ධාරිතා සංවර්ධනය සඳහා

ඉලක්කය	දර්ශකය	හැඳින්වීම
		ලබා දෙන අන්තර්ජාතික සහයෝගිතාව වැඩිදියුණු කිරීම.
	17.9.1	සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වෙනුවෙන් වෙන්කරන ලද මූල්‍ය හා තාක්ෂණික ආධාරයන්හි (උතුරු - දකුණු , දකුණු - දකුණු සහ ත්‍රෙපාර්ශවිය සහයෝගය ඇතුළුව)
17.11		අවම වශයෙන් සංවර්ධනය වූ රටවලින් ලෝක අපනයනයට සපයන කොටස 2020 වන විට දෙගුණ කිරීමේ දැක්මකින් යුක්තව, සංවර්ධනය වෙමින් පවත්නා රටවල අපනයන සැලකිය යුතු මට්ටමකින් වර්ධනය කිරීම.
	17.11.1	ලෝක අපනයනයන්හි සංවර්ධනය වෙමින් පවත්නා සහ ඌන සංවර්ධිත රටවල පංගුව
17.19		2030 වන විට දැනට පවත්නා ක්‍රියාමාර්ග ද උපයෝගී කරගෙන දළ දේශීය නිෂ්පාදනයට අතිරේකව තිරසර සංවර්ධනයේ ප්‍රගතිය මැනීමට මිනුම් සංවර්ධනය කිරීම සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල සංඛ්‍යාන ධාරිතාවන් ගොඩනැංවීමට සහයෝගය ලබා දීම.
	17.19.2	(අ) පසුගිය වසර 10ක කාලය තුළදී අඩු තරමින් එක් ජන හා නිවාස සංගණනයක් හෝ පවත්වා (ආ) 100% ක උපත් ලියාපදිංචි මට්ටමක් සහ 80% ක මරණ ලියාපදිංචි මට්ටමක් ළඟා කරගෙන ඇති රටවල් ප්‍රමාණය.

06. මානව සම්පත් පැතිකඩ

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	67	54	13
තෘතීයික	54	42	12
ද්විතීයික	257	226	31
ප්‍රාථමික	260	210	50

(2021.12.31 දින දක්වා)

6.2 සේවක අතිරික්තය හෝ සේවක හිඟය ආයතනයේ කාර්ය සාධනයට බලපාන ආකාරය

අනුමත සේවක සංඛ්‍යාවට අනුව පුරප්පාඩු පැවතිය ද කාර්යක්ෂම හා ඵලදායී ලෙස මානව සම්පත කළමනාකරණය තුළින් විශිෂ්ට කාර්ය සාධනයක් පවත්වා ගන්නා ලදි.

6.3. මානව සම්පත් සංවර්ධනය

අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධරයන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම තුළින් කාර්යාල කටයුතු කාර්යක්ෂමව හා ඵලදායිව සිදු කිරීමට අවකාශ සැලසීමත්, සේවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමත් අරමුණු කර ගනිමින් දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධරයන් යොමු කරනු ලබයි.

ඒ අනුව, 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා කාලය තුළ ලබා දී ඇති දේශීය පුහුණු පාඨමාලා පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

දේශීය පුහුණු පාඨමාලා සහ පශ්චාත් උපාධි පාඨමාලා

#	පුහුණු වැඩසටහනේ නම	ආයතනයේ නම	ඉලක්ක ගත නිලධරයන්	පවත්වන ලද කාල සීමාවට අදාළ දින	සහභාගී වූ ගණන
.01	පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය	මාණ්ඩලික ශ්‍රේණිය	2021/2019	01
02.	රාජ්‍ය ප්‍රතිපත්ති සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	මාණ්ඩලික ශ්‍රේණිය	2021/2020	01
03.	සේවක කාර්යාභිවර්ධන වැඩමුළුව	අග්‍රාමාත්‍ය කාර්යාලය	ප්‍රාථමික ශ්‍රේණිය	2021.03.30	28
04.	ලිපිගොනු කළමනාකරණය හා කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩමුළුව	අග්‍රාමාත්‍ය කාර්යාලය	ද්විතීයික ශ්‍රේණිය	2021.04.21 22 -	43
05.	තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (මාර්ගගත)	මිලෝදා ආයතනය	මාණ්ඩලික/ ද්විතීයික ශ්‍රේණිය	2021.08.20 දින සිට දින 10ක්	01
06.	MS Excel උසස් නිපුණතා පාඨමාලාව	මිලෝදා ආයතනය	ද්විතීයික ශ්‍රේණිය	2021.09.29 30 -	01
07.	මූලික ඵලදායිතා සංකල්ප පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය	ද්විතීයික ශ්‍රේණිය	2021.06.29 - 2021.10.01 සතියට දින 02ක්	42
08.	රාජ්‍ය පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ පිළිබඳ පශ්චාත් උපාධිය	කොළඹ විශ්වවිද්‍යාලය	මාණ්ඩලික ශ්‍රේණිය	2021/2022	02

#	පුහුණු වැඩසටහනේ නම	ආයතනයේ නම	ඉලක්ක ගත නිලධරයන්	පවත්වන ලද කාල සීමාවට අදාළ දින	සහභාගී වූ ගණන
09	කනිෂ්ඨ විධායකයින් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව	මිලෝදා ආයතනය	ද්විතීයික ශ්‍රේණිය	2021/2022	01
10.	තොරතුරු තාක්ෂණය හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව	ශ්‍රී ලංකා පදනම් ආයතනය	ද්විතීයික ශ්‍රේණිය	2021/2022	02
11.	තොරතුරු තාක්ෂණය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව	ශ්‍රී ලංකා පදනම් ආයතනය	ද්විතීයික ශ්‍රේණිය	2021/2022	02
12.	නිවාඩු භාර නිලධරයාගේ කාර්යභාරය හා වගකීම	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	ද්විතීයික ශ්‍රේණිය	2021	02
13.	කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කිරීමේ පාඨමාලාව	කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ද්විතීයික ශ්‍රේණිය	2021.12.06 -22	05
14.	රජයේ වාහන නඩත්තුව (මාර්ගගත ක්‍රමවේදය)	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	මාණ්ඩලික / ද්විතීයික ශ්‍රේණිය	2021 දෙසැම්බර්	07
15.	ප්‍රතිඵල පාදක ව්‍යාපෘති කළමනාකරණ පාඨමාලාව	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	මාණ්ඩලික / ද්විතීයික ශ්‍රේණිය	2021 දෙසැම්බර්	06
16.	තොරතුරු නිලධාරී පුහුණු වැඩසටහන	ජනමාධ්‍ය අමාත්‍යාංශය	මාණ්ඩලික ශ්‍රේණිය	2021.12.22	01

07. අනුකූලතා වාර්තාව

7.1. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනය ඉදිරිපත් කර තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණය විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කිරීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කිරීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම			
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කිරීම	අදාළ නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර , වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිලිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අදාළ නොවේ		

08. විගණකාධිපති නිරීක්ෂණ

8.1 විගණකාධිපති නිරීක්ෂණ

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TPD/B/PMO/02/21/29 මෙබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 ජූනි 28 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
අග්‍රාමාත්‍ය කාර්යාලය

ශීර්ෂය 2 - අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 2 - අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධි ප්‍රතිපාදන සැලසීම

වැය විෂයන් 02 ක් සඳහා එකතුව රු.72,000,000 ක අධි ප්‍රතිපාදන සලසා ගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු. 58,960,867 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව යලසා ගෙන තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව

රු.13,039,133 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුන ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17 ක සිට සියයට 54 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ආ) බැඳීම් හා බැරකම්

2021 දෙසැම්බර් 31 දින වන විට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව අග්‍රාමාත්‍ය කාර්යාලයට අදාළව රු.20,691,587 ක බැරකම් දක්වා තිබුණත්, මූල්‍ය ප්‍රකාශනවල වූ බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ එම බැරකම් දක්වා නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ආර්ථිකය නගා සිටුවීමේ ජාතික වැඩසටහන

රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ආර්ථිකය ගොඩනැගීමේ වැඩපිළිවෙළට සමගාමීව ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම ප්‍රමුඛතම කාර්යයක් ලෙස හඳුනාගෙන, ඒ අනුව ප්‍රාදේශීය වශයෙන් සපයන සේවාවන් හා ඒවායේ විෂය පථයන්ගේ සම්බන්ධතාවය සැලකිල්ලට ගෙන රාජ්‍ය අමාත්‍යාංශ හා තෝරා ගත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ සම්බන්ධීකරණය යටතේ පහත සඳහන් කමිටු 04 ක් ඇතිකර තිබුණි.

(i) සමාජීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව
(ii) ජීවනෝපාය සංවර්ධන කමිටුව
(iii) දේශීය නිෂ්පාදන කර්මාන්ත වැඩිදියුණු කිරීමේ සංවර්ධන කමිටුව
(iv) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කමිටුව

මූලික අදියර වශයෙන් ඉහත සෑම කමිටුවක් විසින්ම එක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමක් බැගින් සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි රැස්වීම් පවත්වා එහිදි ඉදිරිපත් වන ගැටළු සඳහා විසඳුම් ලබාදීම අපේක්ෂා කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කමිටුව සඳහා එක් එක් දිස්ත්‍රික් රැස්වීම්වලදී ඉදිරිපත් වූ මුළු ගැටළු සංඛ්‍යාව 2,562 ක් වී තිබුණි. රැස්වීම් අවස්ථාවේදීම ගැටළු සංඛ්‍යාව 286 ක් විසඳා තිබුණු

අතර, ඉදිරිපත් වූ ගැටළු සංඛ්‍යාවෙන් ගැටළු 2,276 ක් වූ ඉතිරි තිබුණු අතර එම ගැටළු සංඛ්‍යාව විසඳීමේ ප්‍රගතිය කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණි.

(ii) මෙම වැඩපිළිවෙළ තුළින් ප්‍රාදේශිය වශයෙන් අදාල ගැටළු හඳුනාගෙන ඒකාබද්ධ සංවර්ධන යාන්ත්‍රණයක් ඇතිකොට ඒ තුළින් ප්‍රාදේශීය හා ජාතික සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම අපේක්ෂාව වී තිබුණි. ඒ අනුව, අධික පිරිවැයක් දරමින් දිස්ත්‍රික් රැස්වීම් පවත්වා තිබුණ ද, ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම සඳහා ක්‍රියාත්මක කළ යුතු සංවර්ධන වැඩසටහන් පිළිබඳ යෝජනාවන් ඉදිරිපත් කිරීමට හෝ වැඩපිළිවෙළවල් සකස් කිරීමට ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ඉහළ ප්‍රතිඵලදායක තරුණ ව්‍යාපාර ගම්මාන ව්‍යාපෘතිය

තරුණ දිළිඳුකම දිර්ඝකාලීනව නැරන් කිරීම සඳහා නූතන වෙළඳපොළ හා තාක්ෂණය කෙරෙහි අවධානය යොමු කරමින් විධිමත් වැඩපිළිවෙළක් දියත් කිරීම හා තරුණ ප්‍රජාව සවිබලගැන්වීම සඳහා මෙම ව්‍යාපෘතිය දියත් කිරීමට 2021 අප්‍රේල් මාසයේදී සාකච්ඡා ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සලසා ගැනීමේ හැකියාව, ප්‍රතිපාදන සලසා ගන්නා ආකාරය, අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය, මුළු ව්‍යාපෘතියම ආවරණය වන පරිදි ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම, සැලසුම් කිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය පිළිබඳ කරුණු ඇතුළත් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වාර්තා පිළියෙළ කර ඒ සඳහා අනුමැතින් ලබාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුව තිබුණි. 2022 මැයි 31 දින වන විටත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් ආයතන වෙතින් අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලබා දී තිබුණු වාහන 11 ක් විධිමත් පරිදි කාර්යාලයට පවරා ගෙන නොතිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක. 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව ඉදිරිපත් කරනු ලබන පොදු 47 ආකෘතිය යටතේ වන භාවිතයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් සෑම මුදල් වර්ෂයකම අප්‍රේල් 30 දිනට ප්‍රථම සුදුසු පරිදි කටයුතු කර නිම කළ යුතුව තිබුණි. සමාලෝචිත

වර්ෂයට අදාළව භාවිතයට ගත නොහැකි භාණ්ඩ අයිතම 905 ක් සම්බන්ධව කටයුතු 2022 මැයි 30 දින වන විටත් නිම කර නොතිබුණි

4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දින වන විට කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 104 ක් පුරප්පාඩුව පැවැතුණු අතර එම පුරප්පාඩු අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 13 ක් පුරප්පාඩුව පැවැතුණි.

(ආ) අග්‍රාමාත්‍ය කාර්යාලයට අනුයුක්තව සිටි නිලධාරියෙකු වෙනත් ආයතන දෙකකට නිදහස් කර තිබුණත්, එම නිලධාරියාට 2021 වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.573,248 ක් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් ගෙවා තිබුණි.

ඩී.ඒ.ඒ. වනිගසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට